(1)

538

අධිචෝදනා පත්‍රය

කොළඹ ........................ අධිකරණ කලාපයේ

මහාධිකරණය

18 NOV 2010

...සිංගේ ] රර්ආර්/1308/92/මු.

මහාධිකරණයේ අපරාධ නඩු අංකය } 5377/93

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව

සමන් ප්‍රියංකර ගමගේ

----

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිපති වන තිලක් ජනක මාරපන තුමාගේ නියමය පරිදි යුෂ්මතාට/[illegible] අධිචෝදනා කරන අතර එම අධිචෝදනාවේ ඇතුළත් චෝදනාවල සැටි නම්—

"

වර්ෂ 1989 ක්වූ ජූලි මස 31 වෙනි දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ බල සීමාව තුළ පිහිටි කටුවාන දී හිදී යුෂ්මතා යම් තැනැත්තන් එනම් මිලින්ද, විකුම, ලක්ෂ්මන් සහ පැමිනිලි පක්ෂය නොදත් වෙනත් අයවලුන් සමග ගින්නෙන් හෝ යම් දාහ්‍ය ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරන හෝ විබාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමා ගසන ආයුධයකින් හෝ යම් ආකාරයක උපකරණයකින් අන් කිසි තැනැත්තෙකුට මරණය හෝ තුවාල සිදු කිරීමෙන් හෝ එබන්දක් කිරීමට තැත් කිරීමෙන්, එනම් තුවක්කුවලින් වෙඩි තැබීමෙන් සමරවීර මුදලිගේ දොන් ප්‍රේමකීර්ති ද අල්විස් යන අයගේ මරණය සිදු කල බවත් එමගින් යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 32 වැනි වගන්තිය හා අංක 28 දරන මහජන ආරක්ෂක (සංශෝධිත) පනත සමග කියවිය යුතු වර්ෂ 1989 ක් වූ ජූනි මස 20 වන දිනැති අංක 563/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) ප්‍රකාශිත 1989 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධි විධාන හා බලතල) නියෝගයන් හී 24(1)(අ) නියෝගය ප්‍රකාර වරදක් කල බවත් එබැවින් යුෂ්මතා එකී නියෝගයන් හී 24 වන නියෝගය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය."

---

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්.

වර්ෂ 1992ක්වූ 12 මස 17 වෙනි දින.

කරු/--

(3)

535



පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන දේ

1. සැකකරු විසින් සහකාර පොලිස් අධිකාරී වෙත කරන ලද පාපොච්චාරණය.

2. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව.

-----

18 NOV 2010

පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන සාක්ෂිකරුවන්

1. ප්‍රධාන පොලිස් පරීක්ෂක - රොහාන් ප්‍රනාන්දු - පොලිස් ස්ථානය - හෝමාගම.

2. පොලිස් සැරයන් - 3632 - ආරියරත්න - පොලිස් ස්ථානය - හෝමාගම.

3. පොලිස් කොස්තාපල් - 11297 - මහින්දනාත් - පොලිස් ස්ථානය - හෝමාගම.

4. උප කාන්තා පොලිස් කොස්තාපල් - 1662 - සීතා - පොලිස් ස්ථානය - හෝමාගම.

5. සහකාර පොලිස් අධිකාරී - අනුර සේනානායක - පොලිස් කාර්යාලය - හෝමාගම.

6. පොලිස් කොස්තාපල් - 2377 - ආතර් බංඩා - පොලිස් ස්ථානය - හෝමාගම.

7. පී. රණතුංග - 21/4 - රජමහ විහාර මාවත - නාවින්න.

8. ඩී.ඩී. ධර්මසේන - 37 - දේවාල පාර - පාගොඩ - නුගේගොඩ.

9. දොස්තර වී.එච්.පී. පත්තිල මහත්මිය - දිසා රෝහල - හෝමාගම.

====

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්.

...—15,000 (92/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

1992ක්වූ 12 මස 17 වෙනි දින.

කරු/-.

(4) (13)



/P.

95.04.04

[illegible]

[illegible]

1. [illegible]

2. [illegible]
[illegible]

3. [illegible]

18 NOV 2010

[illegible] / [illegible]

95.04.19

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible] / [illegible]

(5)

2000/01/13

[illegible]

[illegible] 3/7/2000 [illegible]

[illegible]

18 NOV 2010

(8)

(451)

කොළඹ මහාධිකරණ ශාලා අංක.02 හිදිය.

(කොළඹ මහාධිකරණ විනිසුරු ඩී.ජයවික්‍රම මැතිතුමන් ඉදිරිපිටදී ය.)

නඩු අංකය:-5377/93

දිනය:-1994.03.18

- තීන්දුව -

මෙම නඩුවේ, විත්තිකරු වන, සමන් ප්‍රියංකර ගමගේ නැමැත්තාට එරෙහිව, 1989 ක්වූ ජූලි මස 31 වන දින හෝ ඊට ආසන්න දිනයකදී, මෙම අධිකරණ බල සීමාව තුල පිහිටි කටුවාන හි දී, මිලින්ද, වික්‍රම, ලක්ෂමන් සහ පැමිණිලි පක්ෂය නොදත් වෙනත් අයවලුන් සමග, තුවක්කු වලින් වෙඩිතැබීමෙන් සමරවීර මුදලිගේ දොන් ප්‍රේමතිරිති ද අල්විස් නැමැත්තාගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය හා අංක.28 දරණ මහජන ආරක්ෂක (සංශෝධිත) පනත සමග කියවියයුතු, 1989 ක්වූ ජූනි මස 20 වන දිනැති අංක.563/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1989 අංක.1 දරන හදිසි අවස්ථා (විවිධ විධි විධාන හා බලතල) නියෝගයන්හි 24(1)(ආ) නියෝගය ප්‍රකාර වරදක් කල බැවින් එකී නියෝග යන්හි 24 වන නියෝගය යටතේ දඬුවම් ලැබියයුතු වරදක් කල බවට අධිචෝදනාවක් ඉදිරිපත් කර ඇත.

ඉහත සඳහන් 24(1)(ආ) වගන්තිය මෙසේය:-

" ගින්නෙන් හෝ යම් දාහ්‍ය ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරන

හෝ විබාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමා

ගසන අයුධයකින් හෝ යම් ආත්‍ය රයක උප තරණ

යකින් , අන් තැනැත්තෙකුට මරණය සිදු කරන හෝ

තුවාල. සිදු කරන හෝ ආපදාවක් කිරීමට තැත් කරන

යම් තැනැත්තෙකු, වරදකට වරදකරු වියයුතු ය. තවද,

දණ්ඩනීති සංග්‍රහය හෝ මෙම නියෝගවල කුමක් සඳහන්

වුවත් මහාධිකරණය ඉදිරියේ වරද කරු කුරනු ලැබූවිට

මරණ දඬුවමකට හෝ ජීවිතාන්තය දක්වා යන දෙයාකාරයෙන්

ගත
"එක් ආත්‍ාරයක බන්ධනාගාර/ කිරීමකට හෝ යටත්විය යුතුය."

මෙම නඩුවේ විත්තිකරුට එරෙහිව ඇති චෝදනාවේ හරය වන්නේ, ලංකාවේ ප්‍රසිද්ධ කවියෙකු හා ගුවන් විදුලි නිවේදකයෙකු, කලා කරුවෙකු ලෙස ප්‍රසිද්ධියක් උසුලන ලද ප්‍රේමකීර්ති ද අල්විස් නැමැත්තා ගේ මරණය සිදු කිරීමය.

එනම්, මෙම නඩුවේ විත්තිකරු, 'ජනතා විමුක්ති පෙරමුණ' යන දේශපාලන පක්ෂයක නියෝජිතයෙකුව සිටියදී, පසුගිය කාලයේ එම දේශපාලන පක්ෂය විසින් ඇති කරන ලද භීෂණ අවස්ථාවේදී, එම පක්ෂය විසින් නිකුත් කරන ලද නියෝගයක් කඩ කරමින්, රාජකාරියේ යෙදී සිටි බවට චෝදනාවක් කර, ප්‍රේමකීර්ති ද අල්විස් ගේ නිවසට රාත්‍රී කාලයේ ගොස් ඔහුව එළියට ගෙනවිත් මරා දැමූ බව ය.

මෙම නඩුවේ, විත්තිකරුට එරෙහිව මෙම චෝදනාව ඔප්පු කිරීමට ඇති එකම සාක්ෂිය විත්තිකරු විසින් සහකාර පොලිස් අධිකාරී, අනුර සේනානායක මහතාට කරන ලදැයි කියන අපරාධෝච්චාරණය පමණි.

18 NOV 2010

ඒ හැර මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි වන්නේ, විත්තිකරුව අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා විත්තිකරු පිළිබඳව ගන්නා ලද වෙනත් නොයෙකුත් පියවරවල් පිළිබඳව ඉදිරිපත් කර ඇති, පොලිස් නිලධාරීන් ගේ සාක්ෂිය පමණි. පැ.1 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලද එම අපරාධ උච්චාරණය පැමිණිල්ල විසින් සාක්ෂියක් ලෙස ලකුණු කිරීමට සූදානම් වූ අවස්ථාවේදී, විත්තිය, එය සාක්ෂියක් ලෙස ලකුණු කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, පැ.1 වශයෙන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කිරීමට අදහස් කරන ලද ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න සොයා බැලීමට පරීක්ෂණයක් (වොයර්ඩයර්– Voire Dire)පවත්වන ලදී. එම පරීක්ෂණයෙන් පසු, පැ.1 දරණ අපරාධෝච්චාරණය විත්තිකරු විසින් ස්වේච්ඡාවෙන්ම කරන ලද්දක් බවට මෙම අධිකරණය විසින් 1993.08.12 වන දින දරණ නියෝගය මගින් තීරණය කරනලදී. පිටු 44 කින් යුත් මෙ නියෝගය මෙම අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක් බවට අධිකරණය ට පිළිගැනීමට සිදුවූ කරුණු විස්තරාත්මකව සඳහන් කරඇත.

මෙම නඩුවේ ,ඉන්පසුව, ඉතිරි සාක්ෂි මෙහෙයවා නඩු විභාගය අවසන් කරන ලදී.

ඉන් පසුව විත්තිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා, දීර්ඝ වශයෙන් අධිකරණයට කරුණු දක්වමින් දැනට ඉදිරිපත් වී ඇති සාක්ෂි සියල්ල සැලකිල්ලට ගෙන 1993.08.12 වන දින මා විසින් , පැ.1 වශයෙන් ලකුණු කරන ලද පාපොච්චාරණය, ස්වේච්ඡාවෙන් කරන ලද අපරාධෝච්චාරණයක් ලෙස පිළිගැනීම නැවත සළකා බලන ලෙස ඉල්ලීමක් කර සිටියේ ය. එම ඉල්ලීම පිළිබඳව

දැනටමත් මෙම අධිකරණය යම් නිගමනයකට පැමිණ ඇති නිසා, ඒ ගැන නැවතත් සළකා බැලීමට හේතුන් දක්වා නොමැති අතර, ඒ සඳහා අධිකරණ බලයක් ද නොමැත.

විත්තියේ නීතිඥ මහතා තරුණ දක්වමින්, විත්තිකරු අත්අඩංගුවේ සිටි කාලය හා එසේ අත්අඩංගුවේ සිටි ආකාරය හා පොලිසිය මගින් විත්තිකරුට ඇතිවූ නොයෙකුත් බලපෑම් ආදිය සැලකිල්ලට ගැනීමේදීත්, මෙවැනි අපරාධයක් මත විත්තිකරුවෙකු වරදකරු කිරීම සාධාරණ නොවන බවට නොයෙකුත් නීති සිද්ධාන්ත හා නඩු තීන්දු හුවා දක්වමින් තර්කකර සිටියේය.

මෙම චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, හදිසි අවස්ථා රෙගුලාසි යටතේ පනවා ඇති විශේෂිත වූ නීතියක් මත ය. පසුගිය කාලයේ ලංකාවේ ඇතිවූ ඉතාම දරුණු ආණ්ඩු විරෝධී කැරැල්ලක් හේතුවෙන් පැනවූ මෙම නීතිය යටතේ, භීෂණයෙන් සිදුවූ යම් යම් අපරාධ පිළිබඳව අධිකරණයේ නඩු විභාග පැවැත්වීමට අවශ්‍ය සාමාන්‍ය ආකාරයේ සාක්ෂි ලබා ගැනීමට නොහැකි හේතුන් මත, ඒ සම්බන්ධව නඩු පැවරීමේදී අනුගමනය කළයුතු විශේෂිත නීතිරීති, හදිසි නීතිය යටතේ පනවන ලදී. සාමාන්‍ය නීතිය යටතේ පිලි නොගන්නාවූ නීතිරීති, ඒ අනුව මේ සම්බන්ධව පනවන ලදී. එබැවින් අධිකරණයක් විශේෂයෙන් ම මෙවැනි විශේෂ අවස්ථාගත හේතුන් මත පනවන ලද නීතිරීති පිළිබඳවත්, එම කාලසීමාවතුල රටේ පැවති තත්ත්වයන්, මෙවැනි නඩු විභාගයකදී සැලකිල්ලට ගැනීමට සිදුවේ.

18 NOV 2010

(10) (455)

මෙම නඩුවේ සාක්ෂි වලින් හෙළිදරව් වී ඇති පරිදි, මෙවැනි අපරාධයන් පිළිබඳව නඩු විභාගයක් පවත්වන අවස්ථාවකදී සාමාන්‍ය ආකාරයෙන් සාක්ෂි ගෙන්වා ඉදිරිපත් කිරීමට අපහසු බව පෙනීයන කාරණයකි. මෙම අධිකරණයේදී, පසුගිය අවුරුද්දකට ආසන්න කාලය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි නීති පනත යටතේ මෙවැනි නඩු රාශියක් පිළිබඳව විභාගයට ගන්නා ලද අතර, එවැනි බොහොමයක් නඩුවලදී පොලිසිය භාරයේ සිට සටහන් කරන ලද ප්‍රකාශ ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයන් නොවන බවට තීරණය වී ඇත. මෙම අධිකරණයේදී මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයක් ලෙස මෙම අධිකරණයේ පිළිගන්නා ලද එකම අවස්ථාව වේ. යම් කිසි විත්තිකරුවෙකු රක්ෂිත භාරයේ නොතබා පොලිස් ස්ථානවල සහ පොලිසිය භාරයේ තිබෙන වෙනත් ස්ථාන වල රඳවා තබාගෙන තම නෑදෑ හිතමිත්‍රාදීන්, නීතිඥ වරුන් හමුවීමට අවස්ථාවක් නොදී සටහන් කරගන්නා ප්‍රකාශ කෙසේවත් ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශ යයි පිළිගැනීමට නොහැකි ය යන ප්‍රකාශය පිළිගතහැකි ප්‍රකාශයක් වේ. එම හේතූන් මත එවැනි බොහොමයක් අපරාධෝච්චාරණයන් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට ඉඩදීම/ මෙම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම නඩුවේ මෙම අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක් බවට තීරණය කිරීමට හේතුවූයේ, විත්තිකරු වෙනුවෙන් ම ඔහු ඉදිරිපත් කරන ලද සාක්ෂි ය සහ ඔහු වෙනුවෙන් කැඳවන ලද ඔහුගේ මව් ඇතුලු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලින් හෙළිදරව් වූ කරුණු හේතුවෙනි. හදිසි අවස්ථා රෙගුලාසි 60(1) යටතේ යම් විත්තිකරුවෙකු විසින් කරන ලද ප්‍රකාශයක්, සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අනුචිත නොවේ නම් පමණක්, විත්තිකරුට

එවැනි

විරුද්ධව ඔප්පු තලහැකිය. එබැවින් / ප්‍රකාශයන් සාක්ෂි ආඥාපනතේ 24 වන

වගන්තිය යටතේ අදාල නොවන බව ඔප්පු කිරීමේ බාරය ,ඒ අදාල නොවන බව

තරයේ කියා සිටින නැනැත්තෙකු සතු වියයුතු බවට එම නියෝගය මගින් සාදනය

කර ඇත. මෙම් නඩුවේ පැ.1 දරණ අපරාධෝච්චාරණය පිළිබඳව , එහි සටහන්

තුරගත් සහකාර පොලිස් අධිකාරි වරයාගේ සාක්ෂි අවස්ථාවේදී එම ප්‍රකාශය

සාක්ෂි ආඥාපනතේ, 24 වන වගන්තිය යටතේ අදාල නොවන බැව් පෙන්වීමට

විත්තිකරු විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි වලදී මෙම විත්තිකරුට ,එම පොලිස්

නිලධාරීන් පසු අවස්ථා වලදී විශේෂණවයකින් සැලකූ බවට තරුණු හෙළිදරව් විය.

මෙම චෝදනා වේ සඳහන් ප්‍රේමකීර්ති ද අල්විස්, ගිනිඅවියකින් සිදුවූ තුවාල වලින් මියගිය බවට ඒ මරණය පිළිබඳ පවත්වනලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙන් පනාවේ. වෛද්‍ය වී.එස්.පී.පන්නිල මහත්මිය විසින් එම ප.ම.පරීක්ෂණ කරඇති අතර මෘතදේහය මරණකරුගේ බෑනා කෙනෙකු වන පුෂ්ප තරංග රණතුංග හා ඥාතියෙකුවන ලියනගේ දොන් ධර්මසේන විසින් හඳුනාගෙන ඇත. එම ප.ම.වාර්තා වේ, වෙඩිවැදීමකින් සිදුවූ තුවාල 3 ක් සඳහන් කර ඇති අතර,මරණයට හේතුව වශයෙන්, එම ගිනි අවියෙන් ලත් තුවාල වලින් සිදුවූ ලේ ගැලීමකින් හා කම්පණයෙන් සිදුවූ මරණයක් බවට සඳහන් කර ඇත. එම වෛද්‍යවරිය, එම වාර්තාව ඉදිරිපත් කරමින්, පූර්වගාමී විනිසුරුතුමා ඉදිරියේ සාක්ෂි දී ඇත. එම අවස්ථාවේදී, එම පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ.1 වශයෙන් ලකුණුකර ඇති අතර, පසුව අපරාධෝච්චාරණය ද පැ.1 වශයෙන් ලකුණු කර ඇත. එබැවින් එම පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ.1ඒ වශයෙන් ලකුණු කරමි.

මෘත දේහය හඳුනාගත්, පුෂ්ප තරංග රණතුංග ද , අධිකරණයේ සාක්ෂි දෙමින්, මෘත දේහය හඳුනා ගත් බවට සාක්ෂි දී ඇත.

මෙම සාක්ෂි සියල්ල සැළකිල්ලට ගැනීමේදී, ප්‍රේමකීර්ති ද අල්විස්, ගේ මරණයට පත්වී ඇත්තේ, ගිනි අවියකින් තැබූ වෙඩි පහරවලින් බව පැහැදිලිවම ඔප්පු වී ඇත.

18 NOV 2010

(2)

457



මෙම නඩුවේ විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ මහතා රජ - එදිරිව - වොට්සන් 1990 (2) ඕ.එල්.එල්.ඊ.ආර් 293 වැනි පිටුවේ සඳහන් නඩු තීන්දුවට අවධානය යොමු කර, යම් නඩු විභාගයකදී විත්තිකරුවෙකු විසින් කරන ලද අපරාධෝච්චාරණයක් සාක්ෂියක් ලෙස පිළිගැනීමට තීරණය කර තිබෙන අවස්ථාවක එම නඩු විභාගයේදීම නඩු විභාගය අවසන් වීමට පෙර යම් යම් විශේෂ කරුණු හෙළිදරව් වී ඇත් නම් අපරාධෝච්චාරණය සාක්ෂියක් ලෙස ගැනීමේ තීරණය වෙනස් කිරීමට අධිකරණයට බලයක් තිබෙන බවට තර්ක කර සිටියේය. එම නඩු තීන්දුව අනුව එසේ අපරාධෝච්චාරණයක් සාක්ෂියක් ලෙස සැලකීමට කර ඇති තීරණය වෙනස් කිරීමට නම් එම අපරාධෝච්චාරණය එලෙස පිළිගැනීමට නොහැකි වන ආකාරයේ යම් යම් කරුණු රට පසුව නඩුවේදීම හෙළිදරව් විය යුතුය. මෙම නඩුවේ පසුව ඉදිරිපත් වුනු සාක්ෂිවලින්ද, විත්තිකරු විත්ති කූඩුවේ නැගී සාක්ෂි දුන් අවස්ථාවේදීද එම අපරාධෝච්චාරණය ස්වේච්චාවෙන් කරන ලද්දක් නොවන බව පෙන්වීමට අලුතෙන් යමක් හෙළිදරව් වී නොමැත. මෙම නඩු විභාගයේදී මුලින් ඔහු විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරණය ස්වේච්චාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පැවැත්වූ පරීක්ෂණයේදී එක මතයකද ඉන් පසු ප්‍රධාන නඩු විභාගයේදී තවත් මතයකද විත්තිකරු සාක්ෂි දෙමින් තමා අත් අඩංගුවට ගත් අවස්ථාවේදී පොලිසියෙන් සිටි යම් පහර දීම් සිදු වුවත් ඉන් පසු තමාට පොලිස් නිලධාරීන්

යහපත් ලෙස සැලකූ බව පිළිගනීතේය.

මෙම නඩුවේ අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන්ම කරන ලද්දක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පැවැත් වූ පරීක්ෂණය ආරම්භ කිරීමට ප්‍රථම නඩුවේ මුල්ම සාක්ෂිකාරිය ලෙස එම අපරාධෝච්චාරණය සටහන් කර ගන්නා ලද කාන්තා පොලිස් කොස්තාපල් සීතා වනරාණි රණසිංහ සාක්ෂි දෙමින් එම අපරාධෝච්චාරණය විත්තිකරුගේ කැමැත්තෙන් කරන ලද්දක් බවට තටාටත් වැටහී ගිය බවට කරන ලද ප්‍රකාශයට විත්තියේ කිසිම අභියෝගයක් එල්ල නොවීම පිළිබඳව විත්තියේ නීතිඥ මහතා කරුණු දක්වමින් එය අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා යොදා ගැනීමට නොහැකි බවට තර්ක කර සිටියේය. අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ද නැද්ද යන්න සොයා බැලීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ වූයේ එය සටහන් කර ගත් පොලිස් නිලධාරියාගේ සාක්ෂියෙන් බවත්, ඊට පසු එම සාක්ෂිකාරියගේ සාක්ෂිය පැටිනිල්ලෙන් කැඳවා නැති බවටත් තර්ක කර සිටියේය. වේ පිළිබඳව මුලින්ම සඳහන් කළ යුත්තේ මෙම නඩුවේ එකම නඩු විභාගයක් පැවති අතර එම නඩු විභාගය තුළදී පැන නැගුන යම් යම් නීති ප්‍රශ්න පිළිබඳව තීරණයක් දීමට සිදු වී ඇති බවය. නඩු විභාගයක් තුළ තවත් විභාගයක් පැවැත්වීම මුල් නඩු විභාගයෙන් වෙනස් වූ විභාගයක් නොවේ.

18 NOV 2010



අපරාධ නඩුවක චෝදනාවක් මත නඩු විභාගයක් ආරම්භ කර විභාගය පවත්වාගෙන යන අවස්ථාවේදී පැමිණිල්ලෙන් හා විත්තියෙන් නොයෙකුත් නීති ප්‍රශ්න ඉදිරිපත් කරමින් ඉල්ලීම් ඉදිරිපත් වූ විට ඒ පිළිබඳව අධිකරණය විසින් සලකා බලා, තීරණයක් දීම එම නඩු විභාගයේම කොටසකි. මෙම නඩුවේ අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කළාද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂණය මෙම ප්‍රධාන නඩුවේම කොටසකි. මෙම ප්‍රධාන නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කිරීමට අදහස් කළ, විත්තිකරු විසින් කරන ලදැයි කියන ප්‍රකාශය සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීම ගැන විත්තිය විරුද්ධ විය. එම විරුද්ධ වීමට අදාලව පරීක්ෂණයක් පවත්වා අධිකරණය විසින් තීරණයක් කර ඇත. එම තීරණය දීමට පෙර සාක්ෂි වශයෙන් මෙම නඩුවේ පැමිණිල්ලේ අධිචෝදනා පත්‍රයේ සඳහන් සාක්ෂිකරුවන් සහ විත්තිය විසින් කැඳවන ලද සාක්ෂිකරුවන් සාක්ෂි දී පැමිණිල්ල ඉදිරිපත් කරන ලද එම ප්‍රකාශය නීත්‍යානුකූල සාක්ෂියක් ලෙස ඉදිරිපත් කළ හැකිද නැද්ද යන්න පිළිබඳව කරුණු සලකා බලන ලදී. මේ අනුව අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කළා ද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂණය මෙම ප්‍රධාන නඩුවට අදාල වූ අතුරු නියෝගයකට අදාල පරීක්ෂණයකි. එබැවින් නීත්‍යානුකූලව දිවුරුම් පිට හෝ ප්‍රතිඥා මත එම නඩු විභාගයේදී සටහන් කරගෙන ඇති සාක්ෂි හා නඩු වාර්තාවේ සඳහන් කරුණු සැලකිල්ලට ගැනීම නීත්‍යානුකූල වේ.

කෙසේ වෙතත් පැමිණිල්ල විසින් මුලින් කැඳවන ලද එම කාන්තා පොලිස් කොස්තාපල්වරියගේ සාක්ෂි සටහන් කරගෙන ඇත්තේ

මීට පෙර මෙම අධිකරණයේ සිටි පූර්වගාමී මහා ධිකරණ විනිසුරු තුමා ඉදිරිපිටදිය. පසුව මෙම නඩු විභාගය මා ඉදිරියේ අඩාලව තල් තැබූ ස්ථානයේ සිට පවත්වාගෙන යෑමට දෙපාර්ශයේම එකඟත්වය මත 1993. 07. 07 දින තීරණය කරන ලදී. එදිනට පෙර මෙම නඩුවේ වාර්තා ගත කර ඇති සාක්ෂි මා ඉදිරිපිටදී සටහන් කර ගන්නා ලද සාක්ෂි ලෙස සටහන් කර ගැනීමට විත්තිය එකඟ විය. ඒ අනුව නඩු විභාගය මා ඉදිරියේ පැවැත්වෙන ලදී.

ඒ අවස්ථාවේදී මට පෙර මෙම අධිකරණයේ පූර්වගාමී විනිසුරු තුමා ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන් නැවත කැඳවීමට හා ඔවුන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට විත්තිය විසින් ඉල්ලීමක් කළා නම් එට ඉල්ලීමට අධිකරණ සංවිධාන පණතේ 48 වැනි වගන්තිය යටතේ අවසර දීමට හැකිව තිබුනි. නමුත් මුලින් කැඳවන ලද සාක්ෂිකරුවන් නැවත කැඳවීමට හෝ ඔවුන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට විත්තියෙන් කිසිම ඉල්ලීමක් ඒ අවස්ථාවේදී කර නොමැත. එබැවින් එට සාක්ෂිකරුවන් නැවත කැඳවීමේ ප්‍රශ්නයක් පැන නගින්නේ නැත. තවද, මුලින් සඳහන්කිරීම පරිදි මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලද අපරාධෝච්චාරණය ස්වේච්ඡා වෙන් කළ බවට පැමිණිල්ලෙන් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළ යුතු වුවත්, එසේ ඔප්පු කළාට පසු එම අපරාධෝච්චාරණය සාක්ෂි ආඥා පණතේ 24 වැනි වගන්තිය යටතේ අදාල කරගත නොහැකි බව ඔප්පු කිරීම විත්තියට

(16) (461)



අයත් කාරියයකි. එම කරුණ ඔප්පු කිරීම සඳහා විත්තියෙන්ම කැඳවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුව මුලින් විත්තිකරු අත් අඩංගුවට ගන්නා අවස්ථාවේදී යම් යම් බලපෑම් , පහර දීම් සිදු වුවත් ඉන් පසුව විත්තිකරුට පොලිසියෙන් හෝ වෙනත් තැනැත්තෙකුගෙන් එවැනි කිසිම බලපෑමක් නොවූ බවට හෙළිදරව් වී ඇත. අත් අඩංගුවට ගෙන මාස 3 කට පමණ පසු අපරාධෝච්චාරණය සටහන් කර ගන්නා අවස්ථාව වන විට විත්තිකරුට කට ඇතින් හටු වීමට ඉඩදීම පටණක් නොව මහේස්ත්‍රාත් අධිකරණයට පවා ඉදිරිපත් කළ බව විත්තියේ සාක්ෂි මඟින් හෙළිදරව් වී ඇත. එම කරුණු සැලකිල්ලට ගැනීමේදී මෙම නඩුවේ විත්තිකරු විසින් කළාය කියන අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක් බවත්, මෙම අධිකරණය තීරණය කර තිබීම වෙනස් කිරීමට තරම් හේතු විත්තියෙන් දක්වා නොමැති බවට තීරණය කරමි.

18 NOV 2010

මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක් බැවින් සාක්ෂියක් ලෙස අධිකරණයට ඉදිරිපත් කිරීමට හැකි බවට තීරණය කළාට පසු පැමිණිල්ල විසින් විත්තිකරුට එරෙහිව චෝදනා ඔප්පු කිරීම සඳහා තවදුරටත් සාක්ෂි කැඳවන ලදී. අපරාධෝච්චාරණය ස්වේච්ඡාවෙන් කළ බවට තීරණය කළ නිසාම චෝදනාවන් ඔප්පු නොවේ. එම අපරාධෝච්චාරණයේ සඳහන් කරුණුද සාධාරණ සැකයෙන් තොරව අධිකරණය පිළිගන්නේ නම් පමණක් එවැනි සාක්ෂියක් මත විත්තිකරුවෙකු වරදකරුවෙකු කළ හැකිය. නමුත් එසේ විත්තිකරුවෙකු වරදකරුවෙකු කිරීමට ප්‍රථම එම අපරාධෝච්චාරණයේ සඳහන් කරුණු වෙනත් අපරාධ

18 NOV 2010

තවුවක තරුණ සැලකිල්ලට ගන්නා ආකාරයටත් වඩා ප්‍රවේශමෙන් සැලකිලිමත්ව සලකා බලා, එම අපරාධෝච්චාරණයේ සඳහන් කරුණු සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී තිබේද නැද්ද යන්න තීරණය කළ යුතුය.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් එම අපරාධෝච්චාරණ සටහන් කර ගන්නා ලද හා එය සාක්ෂියක් ලෙස සලකුණු කිරීමට ඉදිරිපත් වූ සහකාර පොලිස් අධිකාරි අනුර සේනානායක මහතා සාක්ෂි දී සිටියේය. ඔහු තම සාක්ෂියේදී එම අපරාධෝච්චාරණයේ සඳහන් මෙම අපරාධයට අදාල කොටස් පැ. 7 වී සිට පැ. 7 ඕ යනුවෙන් ලකුණු කර සාක්ෂි දී සිටියේය. එට පැ. 1 වශයෙන් ලකුණු කර ඇති අපරාධෝච්චාරණයන් එලෙස සලකුණු කළ නොවස් අනුව එම ප්‍රකාශ විත්තිකරු නැමැත්තෙන් කළ ප්‍රකාශයක් බව එහි සඳහන්ව ඇත. එය ප්‍රකාශ කරන අවස්ථාවේ කවරට කිසිවෙකු විසින් බලපෑමක් හෝ තර්ජනයක් නොකරන ලද බවත් සඳහන් කර ඇත. තවාගේ පවුලේ සහෝදර සහෝදරියන් කමාත් ඇතුලුව 10 දෙනෙකු සිටින බවත්, එයින් 6 වැනි අයියා වන තරුණ පේන මමගේ නොහොත් මහත්තයා කලින් යුද හමුදාවේ සොල්දාදුවෙකු ලෙස සේවය කර තමා සමග ප්‍රචණ්ඩ ක්‍රියා වලට සහභාගී වී බූස්ස කඳවුරේ සිටින බවත් සඳහන් කර ඇත. 1989 ජූලි මාසයේ මාගම්මන පුරාණ විහාරයේ ලොකු හාමුදුරුවෝ

18 NOV 2010



අපවත් වී එහි ආදාහනය සඳහා කොට්ටි තපේන් සිට ශ 10,000 පමණ ආහාර ගැනීම සඳහා තමා සහ පත්ම සිරි නිවසට යමින් සිටියදී මුහුණ බැඳගත් තුවක්කු අතේ තියා ගත් 6 දෙනෙක් පමණ තමන් ගිය මාර්ගය අහුරා, "ඉන්දියන් හමුදාව ලංකාව නැති කරනවා, උඹලා අපේ ව්‍යාපාරයට බැඳියල්ලා " කියා පැවසූ බවත්, එම ප්‍රකාශයේ සඳහන් වී ඇත. ඔවුන් සමඟ කථා කරමින් සිටින විට හමුදාවෙන් පැන ආ තමාගේ අයියා වන තරුණසේන ගමගේ, පියසිරි නැමැත්තා සමඟ එම ස්ථානයට පැමිණි බවත්, එම දෙදෙනාව දැනට බූස්ස රැඳවුම් කඳවුරේ සිටින බවත්, එම ප්‍රකාශයේ සඳහන් වේ. එම අවස්ථාවේ එම කණ්ඩායමේ සිටි එක් අයෙකු තමා සහ තම අයියා පැත්තකට අඩගහගෙන ගොස් ජේ.වී.පී එකට බැඳී වැඩ කරන්න කැමතිද කියා තමාගෙන් විමසූ බව ත්, තමා එයට කැමැත්ත ප්‍රකාශ කළ බවත් තවදුරටත් සඳහන් වේ. එම කණ්ඩායමේ සිටි නිශාන්ත නැමැත්තා බූස්ස කඳවුරේ දැනට සිටින බවත් එම කණ්ඩායමේ ඔහු නායකත්වය දැරූ බව කමහඩින් තමා දැනගත් බවත් එම ප්‍රකාශයේ සඳහන්ව ඇත. ඉන් දින කීපයකට පසුව තමා පත්මසිරිගේ නිවසට යන විට අයියා වන මහත්තයා ත්, පියසිරි යන අයත්, ප්‍රාදේශීය නායකයෙකු ලෙස හඳුන්වා දුන් මිලින්ද නැමැති පුද්ගලයාත් නිවසේ සිටි අතර, ඔහු රටේ ඇති වී තිබෙන තත්වය සහ ඉන්දියන් හමුදාව ලංකාව ආක්‍රමණය කිරීම පිළිබඳව කථා කළ බවත්, ඉන් පසු තමා පද්මසිරි, පියසිරි, හා තමාගේ අයියා ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් ලෙස

මිලින්ද ඉදිරියේ බැඳුනු බවත් එම ප්‍රකාශයේ සඳහන් වේ. 1982 ජූනි 29 වැනි දින මිලින්ද ද, වික්‍රම නැමැති පුද්ගලයෙකු සමඟ පැමිණ, වික්‍රම ජේ. වී. පී. අංශයේ වැඩ කාරයෙක් බව තමාටත් අයියාටත් පැවසූ බව සඳහන් වේ. ජූනි 31 වැනි දින සවස් 7.00 ට පමණ මිලින්ද තමාගේ නිවසට පැමිණ කටුවාන සීනිම් එකට යන පාර පෙන්වන්න කියා ඉල්ලා සිටි විට තමා කටුවානට යෑමට නැමැත්ත පල කර මිලින්ද සමඟ යා මට එකඟ වූ බව ප්‍රකාශයේ සඳහන් වේ. මිලින්ද තමාට කලින් උපදෙස් දී තිබුන පරිදි ඇස් බැඳ ගැනීමට රෙදි කැබැල්ලක් හා තොප්පියක් තමා ට දුන් බවත්, ඉන් පසු තමාගේ නිවස ඉදිරිපිට පාරේදී වික්‍රම ද එකතු වුනු බවත්, එම තුන් දෙනාට ඊට උඩින් ඇති රබර් වත්තට ගිය විට එම ස්ථානයේ තවත් තුන් දෙනෙක් සිටි බවත්, එම ප්‍රකාශයේ සඳහන් වෙයි. එයින් එක් අයෙකු මන්චි එකේ වැඩ කරන ලක්ෂ්මන් බවට හඳුනා ගත් නමුත් ඉතිරි දෙදෙනා හඳුනා ගත්තේ නැති බව සඳහන් වේ. ඉන් පසු මිලින්ද සහ තමා රබර් වත්ත අසල තිබුන පොල් ඉඩමක පෝර උරයක ඔතා තිබුන තුවක්කු දෙකක් හා පතරොම් 6 ක් එම ස්ථානයෙන් අරගෙන පැමිණි බවත්, හමුදාවේ සිටි තමාගේ අයියා මේ තුවක්කු සඟවා තිබුන ස්ථානය දන්නා නිසා මිලින්ද සමඟ එම ස්ථානයට ගොස් තුවක්කුවලට පතරොම් ගෙනා බවත් එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් කර ඇත. ඉන් පසු

(20)

(401)

හය දෙසාම පිලිනිඳගේ මග පෙන්වීම අනුව තට්ටු තලිත් නොදැන්ගෙන සිටි දැනි දනිසා ප්‍රේමතිර්ති ද අල්විස් මහතාගේ නිවසට ගිය බවට එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් කර ඇත. මෙසේ යන විට පිලිනිඳ අතේ එක තුවක්කුවක්ද, වික්‍රම අතේ එක තුවක්කුවක්ද තිබුන අතර, සියළු දෙනාම මුහුණ රෙදි කඩකින් වසාගෙන තොප්පි දාගෙන සිටි බවත්, පිලිනිඳ කොමාන්ඩෝ කැප් එකක් දාගෙන සිටි බවත්, නාඳුනන දෙදෙනාගෙන් එක් අයෙකු ෂොපින් බෑගයකින් හිස ආවරණය කරගෙන සිටි බවත්, එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වෙයි. ප්‍රේමතිර්ති ද අල්විස් මහතාගේ නිවස ඉදිරිපිට පාරේ අනික් පැත්තේ වෙල අද්දර නිවාස කීපයක ලයිට් දමා තිබුන නිසා එම නිවාස වල ලයිට් නිවීමට මම සහ ලක්ෂ්මන්, වික්‍රමගේ නියෝගයට අනුව ගොස් එම නිවාස වල ලයිට් නිවා දැමීමට නිවැසියන්ට දැන් වූ බවත් ඒ අනුව ඔවුන් ලයිට් නිවූ බවත් ප්‍රකාශයෙන් සඳහන් වෙයි. එම ලයිට් නිවා දමා තමා සහ ලක්ෂ්මන් ප්‍රේමකීර්ති ද අල්විස් මහතාගේ නිවස ළඟට පැමිණ නිවස ඉදිරියේ සිටි කම්බි නිවස ඇතුලත සිටි කට්ටියගෙන් කෙනෙක් ජනෙල් රෙද්ද මෑත් කර පාර දෙස බැලුවේදී ගෙය තුල කොණ්ඩය කැපූ අවුරුදු 18 ක් පමණ ගැහැණු ළමයෙකු සිටිනවා දුටු බව එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වෙයි. එවිට ගෙයි පිටි පස්සෙන් ඇතුල් වීමට ගිය කුඩා දෙනාගෙන් එක් නාඳුනන අයෙකු "උඹට අපි ලියුම් දෙකක් එව්වා. උඹ ඒවා ගනන් ගත්තේ නැහැ" කියා ප්‍රශ්න කරනවා තමාට ඇසුන බවද එම ප්‍රකාශයේ සඳහන් වෙයි. ඒ අවස්ථාවේදී

18 NOV 2000

ගෙයි සිටි අය එම ලියුම ආ වට පස්සේ කථා වැඩිට නොගොස් නිවාඩු පිට සිටිනවා නියා පිළිතුරු දෙනවා තමාට ඇසුන බව ද එහි සඳහන් වෙයි. කුඩා ළමයෙක් හා ගැහැණු කෙනෙක් සිටිනවා ඉමා දුටු බවත්, ඉන් පසු මිලින්ද හා කණ්ඩායමේ නාදුනන අයත් ගෙයි සිටි ප්‍රේමතිරත් ද අල්විස් මහතා සමග කථා කරමින් සිටිනවා දුටු බවත්, එම ප්‍රකාශයේ සඳහන් වෙයි. ඉන් පසුව ප්‍රේමතිරත් ද අල්විස් මහතාද නැටුව පිරිස තවුවාන, මා ගම්මන හන්දිය අසලට පැමිණි බවත් ඒ අතරතුරදී මිලින්ද හා ප්‍රේමතිරත් ද අල්විස් මහතා කථා කරමින් පැමිණි බවත් ප්‍රකාශයේ සඳහන් වෙයි. තවුවාන හන්දියේ මිලින්ද ප්‍රේමතිරත් ද අල්විස් මහතා සමග කථා කරමින් සිටින විට එක වරට අතේ තිබුන තුවක්කුවකින් ඔළුවට වෙඩිල්ලක් තැබූ බවත්, ප්‍රේමතිරත් ද අල්විස් මහතා ඒ වෙලා වේ බිම ඇද වැටුන බවත් එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වී ඇත. එවිට මිලින්ද ඔලුවට තියපන් නියා කිව්ව බවත්, එවිට වික්‍රම නැමැත්තා වෙඩිල්ලක් තැබූ බවත් ඒ සමග ම තවත් තුවක්කුවක් ඇතිව තමා සමග පැමිණි තමා නාදුනන පුද්ගලයින්ගෙන් එක් අයෙකු වැටී සිටි ප්‍රේමතිරත් අල්විස් මහතාට තවත් වෙඩිල්ලක් තැබූ බවත් එම ප්‍රකාශයේ සඳහන් වෙයි. ඉන් පසු සියළු දෙනාම කථාවක් නැතිව වාගම්මන දෙසට පැමිණි බවත්, මිලින්ද තමාට තුවක්කු දෙක හා පතරොම් ආපසු අරන් යන්න නියා තිබූ බවත්, ඒ අනුව තුවක්කු දෙක හා පතරොම් තුන පොල් වත්තේ තිබූ ස්ථානයේම ගෙනත් තිබූ බවත් සඳහන් වෙයි.

8 NOV 2010

(22) (467)

18 NOV 2010

ඉහතින් සඳහන් කලේ මෙම නඩුවේ විත්තිකරු විසින් සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායකට කරන ලදැයි කියන පිටු 04කින් යුත් සතුරු ලේඛනය කරන ලද ප්‍රකාශයෙන් මෙම නඩුවට අදාළ වූ පැ.7 ඒ සිට පැ. 7 ඩී දක්වා වූ කොටස් පමණි. ඉහත සඳහන් කොටස් වලට අමතරව වෙනත් කරුණු පිළිබඳව දීර්ඝ විස්තර එහි සඳහන් වේ. ඉහත-සඳහන් කොටස් ඉදිරිපත් කලාට පසුව සහකාර පොලිස් අධිකාරී වරයා ඉන් එම ප්‍රකාශයේ අඩංගු එම කරුණු සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න අසා සිටියේය. ප්‍රේම කීර්ති ද අල්විස් ජන මාධ්‍යයේ ප්‍රමුඛ ස්ථානයකට නැගී සිටි කෙනෙකු බවත්, නිතර ගුවන් විදුලියෙන් අසන්නට හා රූපවාහිනියෙන් අසන්නට හා දකින්නට ලැබුන තැනැත්තෙකු බවත් මිනිසු ජනප්‍රිය තැනැත්තෙකු බවත්, හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සහකාර පොලිස් අධිකාරීවරයා පිළිගත්තේය. එමෙන්ම සහකාර පොලිස් අධිකාරීවරයාද රූපවාහිනියෙන් මෙම නිතර ගීත ගායනා කරන බවත්, පිළිගත්තේය. මෙම සහකාර පොලිස් අධිකාරී වරයා ගීත ගායකයෙකු වන බව විත්තිකරුද පිළිගෙන ඇති කරුණකි. තවදුරටත් හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තමා හෝමාගම ප්‍රදේශයට පැමිණියේ 1990 ජුනි මාසයේ බවත්, එට ප්‍රථම අවස්ථාවකදීත් මෙම චූදිත අත් අඩංගුවට ගෙන මුදා හැර සිටි තැනැත්තෙකු බවත්, පිළිගත්තේය. එම අවස්ථාවේදී මෙම විත්තිකරු හෝමාගම උසාවියට ඉදිරිපත් කර ඇප පිට නිදහස් කල බවට දැනීමක් ඇතත්, විස්තර කීමට නොහැකි බව සහකාර පොලිස් අධිකාරී වරයා කියා සිටියේය. මේ විත්තිකරුගේ අපරාධෝපචාරණය සටහන් කර ගන්නා

ස්ථානයේදී සතුරු ලියනය කල කාන්තා පොලිස් කොස්තාපල් චරිය සහ ...

බංඩා නැමති රාළහාමි එම ස්ථානයේ සිටි බවත්, විත්තිකරු ඉදිරිපත්

කරන අවස්ථාවේ රොහාන් ප්‍රනාන්දු පැමිණ ආපසු ගිය බවත්, සහකාර පොලිස්

අධිකාරිවරයා පිළිගන්නේය. අපරාධෝච්චාරණය සටහන් කර අවසන් වන

තුරුම ආතර් බංඩා මෙම ස්ථානයේ රැඳී සිටි අතර, ඒ සඳහා විශේෂ

හේතුවක් නොතිබූ බවත්, හෝමාගම ප්‍රදේශය ඒ කාලයේ ත්‍රස්තවාදී කටයුතු

වලදී ඉතා දරුණු පීඩනයකට ලක්වූ ප්‍රදේශයක් බවත්, කවදුරටත් ඔහු කියා

සිටියේය. ආතර් බංඩා එම ස්ථානයේ සිටීමෙන් බලපෑමක් සිදුවේ යැයි

තමා නොසිතූ බවත්, ඔහු හරයි ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් කියා සිටියේය.

එම ආතර් බංඩාට විරුද්ධව දත් ගැලවීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ

නඩුවක් තිබුන බවද සාක්ෂිකරු පිළිගන්නේය. එම නඩුවේ පළවෙනි විත්තිකරු

රොහාන් ප්‍රනාන්දු බවත්, දෙවෙනි විත්තිකරු ආතර් බංඩා බවත්, සාක්ෂිකරු

පිළිගන්නේය. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ ජායාස්ථිත පිටපතක් විත්තිය විසින්

වී.1 ලෙස ලකුණු කර ඉදිරිපත් කලාය. එම නඩුවේ දෙවෙනි විත්තිකරු වන

ආතර් බංඩාත්, තුන, හතර, විත්තිකාර පොලිස් නිලධාරීනුත් එම වී.1 පෙත්සමේ

සඳහන් විපෙත්සම්කරුවන්ගේ නීති විරෝධීව අත් අඩංගුවට ගෙන ඇති බවට

ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර වන්දි ගෙවීමට නියම කර ඇත. එම වී.1

සඳහන් දෙවෙනි වගඋත්තර/කරු මෙම නඩුවේ විත්තිකරු , තමා වෙත අපරාධෝච්චාරණය

කරන අවස්ථාවේ සිටි නිලධාරියා බවද, සහකාර පොලිස් අධිකාරිවරයා පිළිගන්නේය.

එවැනි නඩුවක් ආතර් බංඩාට එරෙහිව තිබුන බව දැනගෙන සිටියේ නම්

ඉදිරිපිට මේ විත්තිකරු අපරාධෝච්චාරණයක් කිරීමේදී ඔහුගෙන් බලපෑමක් සිදුවේ

ඇයි තමා හොඳින් බවත්, සහකාර පොලිස් අධිකාරී වරයා කවුදුරටත් කියා සිටියේය. අපරාධෝච්චාරණය සටහන් කිරීමට ප්‍රථම පොලිසිය විසින්ද මේ විත්තිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බවත්, එම ප්‍රකාශය අඩංගු ලිපි ගොනුව ඒ අවස්ථාවේ තමාගේ භාරයේ තිබුන බවත්, එම ලිපිගොනුව පරීක්ෂා කිරීමෙන් පසුව මෙම අපරාධෝච්චාරණය තමා සටහන් කර ගත් බවත්, සාක්ෂිකරු පිළිගත්තේය. හදිසි අවස්ථා රෙගුලාසි 60 (1) වගන්තියේ විධිවිධාන විත්තිකරුට පැහැදිලි කර දුන් බවත්, මෙම සාක්ෂිකරු කියා සිටියේය. විත්තිකරුගේ ප්‍රකාශයේ සඳහන් පිළිබඳ, වික්‍රම වැනි තැනැත්තන් පිළිබඳව පරීක්ෂණ පවත්වා තිබෙන බවත්, එම පරීක්ෂණ කර ඇත්තේ වෙනත් නිලධාරීන් කණ්ඩායමක් බවත්, ඔහු තවදුරටත් කියා සිටියේය. මෙම විත්තිකරු අත් අඩංගුවට ගත් අවස්ථාවේ තමා එම ප්‍රදේශය වන හෝමාගම සහකාර පොලිස් අධිකාරී නොවූ හෙයින් තමා ඒ පිළිබඳව ක්‍රියාකාරී නොකළ බවද ඔහු කියා සිටියේය. නමුත් අපරාධෝච්චාරණයේ සඳහන් පුද්ගලයින් පිළිබඳව පරීක්ෂණ පැවැත්වූ බවට සටහන් වී තිබුන බව ඔහු කියා සිටියේය. මෙම නඩුවේ විත්තිකරු අත් අඩංගුවට ගැනීමට තමා සම්බන්ධ නොවූ බවත්, එකල තමා මෙම ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරී වරයා නොවුන බවත්, තමා කලේ අපරාධෝච්චාරණය සටහන් කිරීම පමණක් බවත්, මෙම සාක්ෂිකරු තවදුරටත් කියා සිටියේය.

ඉහත සඳහන් අපරාධෝච්චාරණය සටහන් කර ගත් සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක දක්ෂ පොලිස් නිලධාරියෙක් බවත්, විත්තියේ නීතිඥ මහතාද හරස් ප්‍රශ්න වලදී කියා සිටියේය. ඔහු ඒ පිළිබඳව මෙම සාක්ෂිකරුට

මෙසේ යෝජනා කර සිටියේය.

" ප්‍ර: මම තමාට කියන්නේ තමා දක්ෂ පොලිස් නිලධාරියෙක් වුවත් මේ සිද්ධිය සම්බන්ධයෙන් තමාගෙන් ඉටුවිය යුතු සේවය ඉටුවුනේ නැහැ කියලා?

උ: මා පිළිගන්නේ නැහැ. "

විත්තියෙන් මෙම සහකාර පොලිස් අධිකාරී වරයාගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසා ඇත්තේ මෙම අපරාධෝච්චාරණය නිසි අයුරු සටහන් කර ගෙන නොමැති බව පෙන්වීමටය. එමෙන්ම මෙම ප්‍රකාශයේ අඩංගු කරුණු ගැනද ඔහු පරීක්ෂා නොකල බව මෙම හරස් ප්‍රශ්න වලදී යෝජනා කර ඇත. එමෙන්ම ප්‍රේම කීර්ති ද අල්විස් ගේ මරණය සම්බන්ධයෙන් ලිපි ගොනුව වැසීමට අවශ්‍ය නිසා මෙවැනි ප්‍රකාශ ලබා ගත් බවත්, එම මරණය සම්බන්ධයෙන් රජය දැඩි උනන්දුවක් දැක්වූ නිසා ඒ පිළිබඳව මෙලෙස කටයුතු කර ඇති බවත්, යෝජනා කර සිටියේය. ඒ හැර මෙම සහකාර පොලිස් අධිකාරී වරයා අපරාධෝච්චාරණය සටහන් කර ගන්නා අවස්ථාවේ විත්තිකරුට බලපෑමක් කල බවට හෝ තර්ජනයක් කල බවට යෝජනාවක් කර නොමැත. විත්තියෙන් කියන පරිදි විත්තිකරුට මෙම අපරාධෝච්චාරණය කිරීම සඳහා බලපෑමක් තර්ජනයක් එය සටහන් කර ගත් සහකාර පොලිස් අධිකාරී වරයා, කලා නම් ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සහකාර පොලිස් අධිකාරී වරයාගෙන් ප්‍රශ්න කල හැකිව තිබුණි. එසේ වුවත් මෙම සහකාර පොලිස් අධිකාරී වරයාගෙන් එවැනි කරුණු පිළිබඳව ප්‍රශ්න කර නැති අතර, එවැනි

යෝජනාවක්ද කර නොමැත. මේ අනුව මෙම සහකාර පොලිස් අධිකාරී වරයාගේ එම සාක්ෂිය අභියෝගයට ලක්කර නොමැත. ඉහතින් සඳහන් කල පරිදි මෙම අපරාධෝච්චාරණය සටහන් කර ගැනීමේදී වෙනත් නිලධාරියෙකුගෙන් බලපෑමක් සිදු වීමට ඉඩ ඇති බව සඳහන් කර ඇතත් සහකාර පොලිස් අධිකාරී වරයා විත්තිකරුට බලපෑමක්, තර්ජනයක් වූ බවට යෝජනාවක් කර නොමැත. මෙම නඩුවේ ඉහතින් සඳහන් සහකාර පොලිස් අධිකාරී වරයා ගායකයෙකු බවත්, ඔහු විසින් ගායනා කරන ලද ගීත වලට තමා ඇලුම්කන් දෙන බවත්, විත්තිකරු පිළිගෙන ඇත. මේ අනුව මෙම සාක්ෂිකරු අපරාධෝච්චාරණය සටහන් කර ගැනීමේදී විත්තිකරුට යම් බලපෑමක් හෝ තර්ජනයක් කල බවට කරුණු හෙළිදරව් වී නැතිවා පමණක් නොව, ඒ පිළිබඳව ඔහුට අභියෝගයක්ද එල්ල කර නොමැත. ඔහු සහකාර පොලිස් අධිකාරීවරයෙකු බැවින් පසලින් සිටින පොලිස් කොස්තාපල් වරයා ඒ අසල සිටීමෙන් බලපෑමක් වූයේ යැයි විශ්වාස කල නොහැකිය.

පැමිණිල්ලෙන් ඉන් පසුව සහකාර පොලිස් අධිකාරී රෝහන් ප්‍රනාන්දු සාක්ෂි දී සිටියේය. එම සාක්ෂිකරු වී.1 දරණ නඩුවේ පළවෙනි වගඋත්තරකරුවේ. එම නඩුවේදී පළවෙනි වගඋත්තරකරු විසින් පෙත්සම්කරුට වන්දි ගෙවියයුතු බවට නියම කර ඇති නිලධාරියෙකි. එම වී. 1 දරණ නඩුව අදාළ වන්නේ වෙනත් පෙත්සම්කරුවෙකුට අදාළ සිද්ධියකටය. තමා 1990.04.01 දින සෝමානම

පොලිස් මූලස්ථානයේ පොලිස් පරීක්ෂක වරයා වශයෙන් සේවය කල බවත්, ඒ කාලයේ ජේ. වී. පී සම්බන්ධව චූදිතයින් ගැන පරීක්ෂණ කටයුතු වලට යෙදී සිටිය බවත් පිළිගත්තේය. එම කාලයේ හෝමාගම සහකාර පොලිස් අධිකාරි වරයා වශයෙන් සේවය කලේ ජේ.ජේ.ඩී.ගුණතිලක බවත්, තමා ත්‍රස්තවාදී මර්ධන ඒකකයේ භාරව කටයුතු කල බවත් කියා සිටියේය. තමාට පුද්ගලික ඔත්තුකරුගෙන් ලැබුන තොරතුරු අනුව මෙම නඩුවේ විත්තිකරුවා අත් අඩංගුවට ගත් බව්ද, ඔහු කියා සිටියේය. ඒ අනුව 1990.05.06 වෙනි දින මෙම විත්තිකරුත් අත් අඩංගුවට ගත් බවත්, එදින ඔහු අත් අඩංගුවට ගත් ආකාරය සහ එයට සහභාගී වූ නිලධාරීන් හා යොදා ගත් වාහන පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු දක්වා සිටියේය. සැකකරු අත් අඩංගුවට ගැනීමට උත්සාහ ගත් අවස්ථාවේදී ඔහුගේ නිවස පරීක්ෂා කිරීමට ගිය බවත්, එවැනි අවස්ථාවක විත්තිකරු නිවසේ නොසිටි අතර, ඔහු පිටරට ගිය බව නිවසේ සිටි අය ප්‍රකාශ කල බව මෙම සාක්ෂිකරු කියා සිටියේය. ඒසේ වුවත් ඒ පිළිබඳව තමා වැඩිදුරටත් පරීක්ෂාවෙන් සිට මෙම විත්තිකරු තමාගේ කණ්ඩායම විසින් දැක අත් අඩංගුවට ගත් බවත්, එලෙස විත්තිකරු අත් අඩංගුවට ගත්තේ ඔහුගේ නිවසේ සිට සැතපුම් හතරක් පමණ දුර ස්ථානයකදී බව තවදුරටත් කියා සිටියේය. ඒ අවස්ථාවේ විත්තිකරු හඳුනාගත්තේ තම කණ්ඩායමේ සිටි මෙන්ඩිස් රාළහාමි බවත්, ඔහු අත් අඩංගුවට ගැනීමේදී පැන යන්න උත්සාහ කල නමුත් , අවහිරයක් නොතිබුන බවත්, පිළිගත්තේය. විත්තිකරු අත් අඩංගුවට ගෙන එදින

18 NOV 2010

රාත්‍රී 9.30 ට පොලිස් ස්ථානයට පැමිණ සැකකරු සමඟ වැව්දුර පරීක්ෂණ පැවැත්වූවට වෙනත් ප්‍රදේශවලට යාමට සිදුවූ බවත්, ඔහු පිළිගන්නේය. ඉන් පසුව විත්තිකරු 3 උප සේවයට භාර දී ඔහු රඳවා ගැනීමේ නියෝගයක් සහකාර පොලිස් අධිකාරී ගුණතිලකගෙන් ලබාගත් බවද කියා සිටියේය. එවැනි නියෝගයක් ලබා නොගෙන් පොලිස් නිලධාරීගේ අභිමතය පරිදි ඔහු රඳවා ගැනීමට නොහැකි බව දන්නා නිසා බව ඔහු පිළිගන්නේය. එම රඳවා ගැනීමේ නියෝගය 90.05.07 වෙනි දින සිට දින 90 කට වලංගු වන ආකාරයට ලබා ගත් බවත්, පැ. 3 වශයෙන් ඉදිරිපත් කර ඇත්තේ එම රඳවුම් නියෝගයේ මුල් පිටපත බවත්, ඔහු කියා සිටියේය. පසුව මෙම විත්තිකරුගේ අපරාධෝච්චාරණය සටහන් කර ගැනීම සඳහා සහකාර පොලිස් අධිකාරී වරයා වෙත ඉදිරිපත් කළ බවද, ඔහු පිළිගන්නේය. මේ අනුව 1990.08.30 වෙනි දින සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායකට ඒ බව දැනුම් දී විත්තිකරු ගේ අපරාධෝච්චාරණය සටහන් කර ගැනීම සඳහා ඉදිරිපත් කළ බවද ඔහු කියා සිටියේය. මේ අනුව අපරාධෝච්චාරණයක් විත්තිකරුගෙන් සටහන් කරගෙන ඇත්තේ විත්තිකරු අත් අඩංගුවට ගෙන මාස 3 1/2 කට පසුවය. අපරාධෝච්චාරණය සටහන් කර ගත්තාට පසුව සහකාර පොලිස් අධිකාරී වෙත විත්තිකරු ඉදිරිපත් කළ ආතර් බංඩා රාජගාමි විසින් නැවත විත්තිකරු උපසේවයට භාර දුන් බවත්, ඔහු පිළිගන්නේය. ඊට අමතරව මේ විත්තිකරු 1990.05.06 වෙනි දින අත් අඩංගුවට ගත් පසුව බී වාර්තා අංක 3157 සටහනේ හෝමාගම මහේස්ත්‍රාත් වරයා වෙත 1990.06.06

දින ඉදිරිපත් කල බවද කියා සිටියේය. මේ අනුව මෙම වික්ෂිප්තරු ගෙන් අපරාධෝච්චාරණයක් පටහන් කර ගැනමට මාස 2 1/2 කටත් කලින් මහේස්ත්‍රාත් වරයා වෙත ඉදිරිපත් කර ඇත. එලෙස මහේස්ත්‍රාත් වරයා වෙත ඉදිරිපත් කර තමා විසින්ම සටහන් කරන ලද එම චෝදනා මත බවත්, එය පැ. 4 වශයෙන් ඉදිරිපත් කරමින් මෙම සාක්ෂිකරු කියා සිටියේය. ඉන් පසුව නැවතත් පැ. 5 දරණ රඳවුම් නියෝගයක් වික්ෂිප්තරු වෙනුවෙන් දින 30 කට ලබා ගත් බවත්, ඔහු කියා සිටියේය. එයට අදාළ වෙනත් ලේඛණ පැ. 6 වශයෙන්ද ඔහු ඉදිරිපත් කලේය. අත් අඩංගුවට ගෙන මාසයක් ඇතුලත මහේස්ත්‍රාත් වරයෙකු වෙත ඉදිරිපත් කල හෙයින් නීතියට එකගව තමා වික්ෂිප්තරුව එලෙස ඉදිරිපත් කල බවත්, වික්ෂිප්තරු හදිසි නීතිය යටතේ දීර්ඝ කාලයක් රඳවා ගනු ලබන්නේ පැය 24 ක් [illegible] රඳවීමට ප්‍රමාණවත් නොවන නිසා බවද ඔහු කියා සිටියේය. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තමා හෝමාගම පොලිසියට පැමිණ මාසයකුත් දවස් 6 ක් ගතවූ විට මේ වික්ෂිප්තරු අත් අඩංගුවට ගත් බවත්, එලෙස අත් අඩංගුවට ගත්තේ පිටිපන ප්‍රදේශයේ සිටි තමාගේ ඔත්තුකරුවෙකු මගින් බවත්, කියා සිටියේය. තමා ඉදිරිපත් කල රඳවුම් නියෝගය අනුව මෙම වික්ෂිප්තරු 07 වන මාසයේ 28 වෙනිදා සිට පැලවත්ත රඳවුම් කඳවුරේ තබා ගන්නා ලෙස රඳවුම් නියෝගයක් ලබාගත් බවත්, ඒ අනුව තමා ක්‍රියා කල බවත්, කියා සිටියේය. නමුත් පැලවත්ත කඳවුරේන් මේ වික්ෂිප්තරු

භාර ගැනීමට නොපැමිණි බවත්, ඔවුන් පැමිණ භාර ගන්නා තුරු පොලීසියේ රඳවා ගත් බවත්, කියා සිටියේය. විත්තිකරු එලෙස වෙනත් කඳවුරකට භාරදීමේ කටයුතු වෙනත් අංශයකින් කරන බවත්, එය භාරව සිටින්නේ, ජනානන්ද [illegible] නැමැත්තා බවත් කියා සිටියේය. මෙවැනි සැකකරුවන් පිළිබඳව විශේෂ ආරක්ෂක විධිවිධාන ඇති බැවින් පෙලවත්ත කඳවුරට ගෙන යන සැකකරුවන් යවනු ලබන්නේ එම කඳවුරෙන් දැනුම් දුන් පසුව බවද, ඔහු කියා සිටියේය. එලෙස මෙම රඳවුම් කඳවුරේ නැවැත්වීමට නියම කර ඇති මේ පුද්ගලයාගෙන් ජූලි 24 වෙනිදා, නියෝගයෙන් මාසයකුත් දවස් හයකට පසුව සහකාර පොලිස් අධිකාරී වරයා වෙත අපරාධෝච්චාරණයක් සඳහා ඉදිරිපත් කල බව ඔහු පිළිගත්තේය.

මෙම නඩුවේ මෙම සැකකරු 1990 මැයි 06 වෙනි දින අත් අඩංගුවට ගැනීමට ප්‍රථම වතාවකුත් ඔහු අත් අඩංගුවට ගෙන මුදාහැර ඇති බව තමාට ආරන්චි වුන බව මෙම සාක්ෂිකරු පිළිගත්තේය. මුල් අවස්ථාවේ ඔහු යුද්ධ හමුදාවෙන් අත් අඩංගුවට ගෙන පරීක්ෂණ පවත්වා අධිකරණයට ඉදිරිපත් කර මුදාහැර ඇති බව මේ සහකාර පොලිස් අධිකාරී වරයා පිළිගත්තේය. එවකට එම ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරීව සිටි ගුණතිලක මහතා විසින් මෙම විත්තිකරු මුල් අවස්ථාවේ මුදාහැර ඇති බව, එකල තමා එම ප්‍රදේශයේ සේවය [illegible] නොකල බවද මෙම සාක්ෂිකරු පිළිගත්තේය. මෙහිම සිද්ධියෙන් මියගිය ප්‍රේම කීර්තිද අල්විස් මහතා ප්‍රසිද්ධ කැනැත්තෙකු බැවින් ඒ පිළිබඳව විශේෂඥයන් නොදැන්වූ බවත්

වෙනත් අපරාධයක් හා සමානව පරීක්ෂණ පැවැත්වූ බවත්, මෙම සාක්ෂිකරු කියා සිටියේය. අපරාධෝච්චාරණය සටහන් කර ගැනීමට පැවි අවස්ථාවේ මේ විත්තිකරු පොලීසියට කල ප්‍රකාශයේ පිටපතක් හා පරීක්ෂණ වල උධෘත පැවි බව මහු පිළිගත්තේය. මෙම අපරාධෝච්චාරණය කිරීමට සතියකට පෙර විත්තිකරු එවැනි ප්‍රකාශයක් කිරීමට අවශ්‍ය පැයි තමාට දැන්වූ බවත්, ඉන් දින කීපයකට පසුව කණිෂ්ඨ සහකාර පොලිස් අධිකාරිරයා වෙත ගොස් දැනුම් දුන් බව කියා සිටියේය. විත්තිකරු එවැනි ප්‍රකාශයක් කිරීමට කැමැත්ත ප්‍රකාශ කල නමුත්, විත්තිකරුට තවදුරටත් ඒ පිළිබඳව සිතා බැලීමට අවස්ථාව දී දින කීපයකට පසුව එලෙස සහකාර පොලිස් අධිකාරී වරයාට දැනුම් දුන් බවද මෙම සාක්ෂිකරු කියා සිටියේය. විත්තිකරු ඒ සඳහා ඒගෙන සිය ආකර් බංඩා සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් පැවැත්වූ බවත්, ඒ පරීක්ෂණ පැවැත්වූයේ දක් ගැලවීමක් සම්බන්ධව නොව සැපකරුවන් අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් බවත් කියා සිටියේය. එම ආකර් බංඩා නැමති පොලිස් කොස්තාපල් වරයා මානවිමා අයිතිවාසිකම් නඩුවේ වරදකරුවෙක් වූ බවද, මෙම සාක්ෂිකරු පිළිගත්තේය. ඊට ප්‍රථමත් මේ විත්තිකරුට එරෙහිව ගිනි තැබීමක් සම්බන්ධයෙන් චෝදනාවක් එල්ල කර හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල බවද පසුව දැන ගත් බව හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකරු පිළිගත්තේය. කඩුදාවේ වැඩ කරන උසස් නිලධාරියෙකු වන මහිපාල නැමැත්තාගේ ගෙට ගිනි තැබීම සම්බන්ධව

18 NOV 2010





වූ සිද්ධියක් බවත්, ඒ පිළිබඳව විත්තිකරු කිසිත් නොදන්නා බවත්, කියා සිටියේය. මේ විත්තිකරු පිළිබඳව හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් නොපැවැත්වූ බවත්, පොලිසියේ දීර්ඝ කාලයක් විත්තිකරු සිටි නිසා හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් අවශ්‍ය නොවේයැයි තමාට හැඟී ගිය බවත්, ඔහු කියා සිටියේය. විත්තිකරු රඳවා සිටියේ නිතර යන එන අයට පෙනෙන ස්ථානයක බවත්, ඔහු කියා සිටියේය.

විත්තිකරුගෙන් වරින් වර ප්‍රශ්න කල බවත්, ඒ අතරතුර පරීක්ෂණ කටයුතු වලට අදාලව සහ විත්තිකරුගේ සුභ සාධනය සඳහා, හා ආරක්ෂාව සම්බන්ධයෙන්ද, ප්‍රශ්න කල බවත්, ඔහු තවදුරටත් කියා සිටියේය. මේ විත්තිකරු අත් අඩංගුවේ සිටින කාලයේ කිසිම අවස්ථාවක කිසිම කෙනෙකුට විරුද්ධව පැමිණිල්ලක් කර නොමැති බව ඔහු තවදුරටත් කියා සිටියේය. මෙයට සම්බන්ධ කැනැත්තන් අත් අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ පැවැත්වූ බවත්, සමහර අය පැනවී සිටි බවද, සමහර අය භීෂණ සමයේ අතුරුදහන් වී ඇති බවට තොරතුරු ලැබී ඇති බව කියා සිටියේය. මෙම නඩුවේ ඉහත සඳහන් පොලිස් නිලධාරියාගේ සාක්ෂි වලින් හරස් ප්‍රශ්න වලදී හෙළිදරව් වූ කරුණු සැලකිල්ලට ගැනීමේදීත් මේ විත්තිකරු අත් අඩංගුවට ගත් එම පොලිස් නිලධාරියා විත්තිකරු අත් අඩංගුවට ගෙන මාසයක් ඇතුලත මහේස්ත්‍රාත් වරයා වෙත ඉදිරිපත් කර ඇත.

තවද ඔහු පොලිසියට යන එන අයට පේන ස්ථානයක රැඳවා සිටි බවද ප්‍රකාශ කර ඇත. මෙම පොලිස් නිලධාරියා ඔහු සටකේ සේවය කල බව ආතර් බංඩා රාළහාමි මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් නඩුවේ වරදකරු

වී ඇති බවට කරුණු හෙළි දරවු විය. මෙම නඩුවේ පැමිණිලිකරුට පහර දුන් බවක් හෝ වෙනත් බලපෑමක් කල බවට ඔහුගේ සාක්ෂියෙන් කරුණු හෙළිදරව් වී නොමැත. නිගමිත ආකාරයෙන් අඳුවීම් නියෝගයක් ලබාගෙන ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත ඇති අතර, නීතියට එකඟව මහේස්ත්‍රාත්-වරයා වෙත ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරුට යම් බලපෑමක් තර්ජනයක් වූයේ නම් පැමිණිලිකරුට ඒ පිළිබඳව මහේස්ත්‍රාත් අධිකරණයේ කරුණු දැක්වීමටත් මේ අනුව අවස්ථාවක් ලැබී ඇත. මෙම සාක්ෂිකරු හා ආතර් බංඩා හැමැත්තාත් වෙනත් සැකකරුවන් පිළිබඳව ගත් යම් යම් ක්‍රියාවන් හේතුවෙන් චෝදනා එල්ල වී ඇති නමුත් මෙම නඩුවේ පැමිණිලිකරුට විරුද්ධව මෙම නිලධාරියා විසින් ඔහු අත් අඩංගුවට ගත් පසු පහරදීමක් හෝ අමානුෂික ලෙස සැලකූ බවට ප්‍රශ්න කර නොමැත.

18 NOV 2010

ඉහත සඳහන් සහකාර පොලිස් අධිකාරීවරයා විසින් මෙම නඩුවේ විත්තිකරු, අපරාධෝච්චාරණයක් සටහන් කර ගැනීම සඳහා සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක වෙත ඉදිරිපත් කරන ලද්දේ, විත්තිකරුගේ ඉල්ලීම මත බවට කරන ලද ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් බවට විත්තියෙන් යෝජනා කරන ලද නමුත්, ඔහු එය ප්‍රතික්ෂේප කර සිටියේය. තවද, මෙම විත්තිකරුට මෙන්ඩිස් නැමැති පොලිස් නිලධාරියා පහර දුන්න බවට ද විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කල නමුත්, එය ඔහු විසින් ප්‍රතික්ෂේප කළේය. ඒ හැර, එවකට සෝමාගම පොලිස් ස්ථානාධිපතිව සිටි මෙම නිලධාරියා, මෙම විත්තිකරුව අත් අඩංගුවට ගැනීමට මූලිකව කටයුතු කල නිලධාරියා වුවත්, ඔහු විත්තිකරුට පහර දුන්න බවට හෝ බලපෑමක් කල බවට අභියෝග කර නොමැත. ආතර් බණ්ඩා දත් ගැලවීම පිළිබඳව ප්‍රසිද්ධියක් දරන තැනැත්තෙකු හැටියට ඔහුගෙන් බලපෑමක් සිදුවීමට බොහෝසෙයින් ඉඩකඩ තිබූ බවට සහ මෙන්ඩිස් නැමැත්තා පහර දුන්න බවට කල යෝජනාව හැර මෙම සහකාර පොලිස් අධිකාරී වරයා විත්තිකරුට යම් බලපෑමක් හෝ තර්ජනයක් කල බවට යෝජනාවක්වත් කර නොමැත.

ඉහත සඳහන් කරුණු සැළකිල්ලට ගැනීමේදී අපරාධෝච්චාරණය සටහන් කර ගත් අනුර සේනානායක සහකාර පොලිස් අධිකාරීවරයා ට හෝ මේ විත්තිකරු අත් අඩංගුවට ගෙන පොලිසියේ රඳවාගෙන සිට, අපරාධෝච්චාරණය සටහන් කර ගැනීම සඳහා ඉදිරිපත් කුළ, මෙම සාක්ෂිකරුට එරෙහිව, විත්තිකරුට තර්ජනයක් හෝ බලපෑමක් කල බවට අභියෝගයක් කර නොමැති බැවින්, විත්තිකරු සිය

සිය නැමැත්තෙන්ම මෙම අපරාධෝච්චාරණය කළ බව සනාථ වේ. මෙම පොලිස් නිලධාරීන් දෙදෙනා උසස් නිලධාරීන් බැවින්, රට පහළ සිටින නිලධාරීන්ගෙන් යම් බලපෑමක් වූයේ නම්, මෙම නිලධාරීන්ට ඒ පිළිබඳව පැමිණිලි කිරීමට විත්තිකරුට හැකියාවක් තිබුනි. එමෙන්ම, අත්අඩංගුවට ගෙන මාසයක් තුලදී, මහේස්ත්‍රාත්වරයා වෙත විත්තිකරුව ඉදිරිපත් කර ඇත. විත්තිකරුට යම් යම් තර්ජන හා බලපෑම් තිබුනා නම් හෝ විත්තිකරු ~~ප්‍රකාශ~~ කර ඇති පරිදි, මෙන්ඩිස් නැමැති පොලිස් නිලධාරියා, විත්තිකරුට පහරදී විත්තිකරුගේ ශරීරයේ ඉදිමීම්, සීරීම් යනාදී තුවාල තිබුනා නම්, ඒ පිළිබඳව පැමිණිලි කිරීමට ද විත්තිකරුට හැකියාවක් තිබුනි. නමුත් විත්තිකරු ඒ පිළිබඳව මහේස්ත්‍රාත්වරයා ට හෝ උසස් නිලධාරීන්ට පැමිණිලි කර නොමැත.

මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරනයේ සඳහන් කරුනු සම්බන්ධව පැමිණිල්ලේන් කැඳවන ලද සහකාර පොලිස් අධිකාරීවරුන් දෙදෙනෙක් ගෙන් ප්‍රශ්ණ කර ඇත්තේ, ප්‍රේමකීර්ති ද අල්විස් ~~[illegible]~~, ප්‍රසිද්ධ කලා කාරයෙකු හා රජයේ උසස් අය අඳුනන තැනැත්තෙකු නිසා ඔහුගේ මරණය සම්බන්ධයෙන් වූ ලිපි ගොනුව අවසන් කිරීම සඳහා කිසියම් කව්රුහෝ වේවා එයට සම්බන්ධ කිරීමට උත්සාහයක් ගත්තු බව පෙන්වීමට ය. එසේ නොමැතිව එම අපරාධෝච්චාරණය ප්‍රේමකීර්ති ද අල්විස් ගේ මරණයට අදාලව ඇති කොටස් අසත්‍ය ප්‍රකාශයන් බව හෝ බලපෑමක් මත මෙම නිලධාරීන් දෙදෙනා විසින් ලබා ගත්ත ඒවා බවට අභියෝගයන් කර නොමැත. වෙනත් නිලධාරීන් විත්තිකරුට පහරදුන්න බවට යෝජනා කර ඇත්ත්, ඉහතින් සඳහන් සහකාර පොලිස් අධිකාරී

18 NOV 2010

(26)



(281)

විරුද්ධ දෙදෙනාට එරෙහිව එවැනි අභියෝගයක් එල්ලකර නොමැත. තවද, එම විත්තිකරුගේ අපරාධෝච්චාරණයෙහි ඇති එම කරුණු සැළකිල්ලට ගැනීමේදී එවැනි විස්තරාත්මක කරුණු පොලිස් නිලධාරියෙකුට වුවද ගොතා ඉදිරිපත් කළහැකි ආකාරයේ ඒවා යයි විශ්වාස කළ නොහැකිය. යම් තැනැත්තෙකුට බලපෑමක් කර, චෝදනාවකට වරද පිළි ගැනීමක් එසේ නැතහොත් එම චෝදනාවට සම්බන්ධවන ආකාරයේ ප්‍රකාශයක් සටහන් කළහැකිවුවත්, මෙම නඩුවේ අපරාධෝච්චාරණයේ සඳහන් ආකාරයට විස්තරාත්මකවූ කරුණු විත්තිකරුගෙන් හැර වෙනත් තැනැත්තෙකුට අසත්‍ය ලෙස සම්පාදනය කළ හැකියයි විශ්වාස කළ නොහැකිය.

රජයට මුලින්ම සාක්ෂි දුන්න අපරාධෝච්චාරණය සටහන් කරගත්, සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා නැවත කැඳවා තමා මුලින් පැ.1 වශයෙන් ලකුනුකර ඉදිරිපත් කල අපරාධෝච්චාරණයේ දෙවන පිටපත ඉදිරිපත් කරසිටියේය. මුල් පිටපතේම කාබන් පිටපතක් වන එම දෙවන පිටපතේ අවශ්‍ය ස්ථානවල විත්තිකරු අත්සන් කර ඇති බවත් එම අත්සන් ඔහු මුල් පිටපතේ ද එලෙස අත්සන් තබා ඇති බවත් කියාසිටියේය. එම කාබන් පිටපතේ විත්තිකරුගේ අත්සන යොදා ඇත්තේ තීන්තෙන් බවත් එය කාබන් වැදුන අත්සනක් නොවන බවත් ඔහු කියාසිටියේය. තවද එම පිටපතේ අපරාධෝච්චාරණය ලබා ගත්ත බවට සහතික අත්සන් කර ඇති බව ද කියා සිටියේය. සාමාන්‍යයෙන්, විශේෂයෙන්ම අපරාධෝච්චාරණයක් යතුරු ලියනය කරන විට, පිටපත් දෙකක් සහිතව යතුරු ලියනය කරන බවත්, එයින් මුල් පිටපත ගොනුවට ඇතුලත් කරන බවත් කියාසිටියේය.

මෙම අපරාධෝච්චාරණයට අදාල මුල් පිටපත ගොනුවේ නොමැති බවත් එය ගොනුවෙන් සෙවීමට සෑම උත්සාහයක්ම ගත් අතර, යම් අතපසුවීමකින් එය මුල් ගොනුවට ගොනුවී නොමැති නිසා, එයටඅදාල නිලධාරීන්ට විරුද්ධව දැනටමත් විශේෂ පරීක්ෂණයක් පවත්වාගෙන යන බව මෙම සහකාර පොලිස් අධිකාරී වරයා කියාසිටියේය. මෙම නඩුවට ලකුණුතර ඉදිරිපත් කරන ලද පැ.1 දරණ මුල් පිටපත හා එහි කාබන් පිටපතේ තමන්ගේ හා විත්තිකරුගේ අත්සන් නියමිත ස්ථාන වල හා වෙනස් තම් තරන ලද ස්ථානවල තීන්තෙන් යොදා අත්සන් තබා ඇති බව ඔහු කියාසිටියේය.

මෙම නඩුවට අදාල අපරාධෝච්චාරණයේ මුල් පිටපත ඉදිරිපත් නොකිරීම පිළිබඳව විත්තියෙන් ප්‍රශ්න කර නැති හෙයින් කාබන් පිටපත ඉදිරිපත් කිරීමට අවසර දෙන ලදී.

දෙවන අවස්ථාවේදීද කාබන් පිටපත ඉදිරිපත් කිරීමට සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා සාක්ෂිදුන් අවස්ථාවේදී, විත්තියෙන් ඔහුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. ඒ අනුව මුල් පිටපත පො.ක.නො.ආතර්බණ්ඩා ට දුන්න බවත්, අවුරුදු 3 කට පමණ පසුව මුල් පිටපත නොමැති වීම පිළිබඳව නුගේගොඩ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් පරීක්ෂණයක් පවත්වන බවත් කියා සිටියේය. ඒ හැර වෙනත් හරස් ප්‍රශ්න අසා නැත.

ඉහත සඳහන් සාක්ෂියත් සමග, පැ.1 සිට පැ.6 දක්වා ලේඛන ඉදිරිපත් කරමින් පැමිණිල්ල සාක්ෂි මෙහෙයවා අවසන් කරන ලදී.

මෙම නඩුවේ, ඉහතින් දැක්වූ කරුණු සැලකිල්ලට ගැනීමේදී පැ ... ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් හෙළිදරව් වූ කරුනු අනුව විත්තිකරු විසින්

එම ප්‍රේමකීර්ති ද අල්විස් ගේ මරණය සිද්ධ කල වේදී, නිවස තුල සිටි තැනැත්තන්, ඔවුන් කථා කල දේ පවා විත්තිකරු සිටි බවත්, මරණයෙන් පසුව, කිසි කලබලයක් නොමැතිව අසපු ම මරණය සිදු කිරීමට යොදවා ගත්ත තුවක්කු හා පතරොම් විත්ති පසු බාරගෙන සඟවා තබා ඇත. ප්‍රේමකීර්ති ද අල්විස් ගේ මරණය ම සඳහා වෙඩි පහරවල් එල්ල කරන ලද්දේ, මිලින්ද වික්‍රම හා තවත් පුද්ගලයෙකු වුවත්, ඉහත සඳහන් පරිදි, එම ක්‍රියාව කිරීමේදී ර්ති ද අල්විස් ගේ නිවස පවා පෙන්වා දී මේ විත්තිකරු එම අපරාධයට ගී වී ඇත. මේ අනුව මෙම විත්තිකරු, 'පොදු මරණීය චේතනාවක් ඇතිව, ර්ති ද අල්විස් ගේ මරණය සිදු කිරීමට සහභාගී වී ඇති බව' පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇත. පැ.7චී සිට තිව් දක්වා වූ ඩොච්චාරණයේ සඳහන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද කොටස් සැලකිල්ලට මීදී, එවැනි කරුණු මෙම අපරාධයට සහභාගී වූ තැනැත්තෙකු ගෙන් හැර තැනැත්තෙකුගෙන් ලබා ගතහැකි කරුණු නොවන බව පෙනීයයි.

මෙම නඩුවේ ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමේදී, විත්තිකරුට ඇති චෝදනාව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු විය හැකි ආකාරයේ පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇත.

18 NOV 2010

ප්‍රේමකීර්ති ද අල්විස් ගේ මරණය සිදු කිරීමට සහාය වී ඇති බව පෙනී
එම ප්‍රේමකීර්ති ද අල්විස් ට, මිලින්ද හා චිත්‍රම යන අය වෙඩි තබන
ලද අතර, රට අමතවර, ලක්ෂමන් සහ එම කණ්ඩායමේ සිටි සෙසු පිරිස
සමග ප්‍රේමකීර්ති ද අල්විස් ගේ නිවස සොයා ගැනීම සඳහා මග පෙන්වා
මෙම විත්තිකරු ය. එමෙන්ම එම මරණය සිදු කරන තුරු, අවට නිවෙස්
විදුලි පහන් නිවීමට කටයුතු කර ඇත්තේ මෙම විත්තිකරු ය. එපමණක්
නොව, මෙම විත්තිකරුගේ සහෝදරයෙකු යුද හමුදාවෙන් ඉවත් වී මෙයට
සහභාගී වී ඔහු ද බූස්සේ රඳවා ඇති බව ද එමෙන්ම, පියසිරි නැමැත්තා
බූස්සේ රඳවා ඇති බවත්, එම තැනැත්තන් ද මෙයට සහභාගී වූ බවත්
පැහැදිලි ව ඔප්පු වී ඇත. තම නායකයාගේ නියමය පරිදි, මෙම මරණය
කිරීමට ආයුධ තිබූ ස්ථානයෙන් ගෙනත් දීම, එමෙන්ම එම මරණය සිදු
සූදානම් වීමක් වශයෙන්, රෙදි කඩවලින් මුහුන වසා ගැනීම යන ක්‍රියා
මෙම විත්තිකරු සිය කැමැත්තෙන්ම සහභාගී වී ඇත.

ඒ අනුව, මෙම මරණය සිදු කිරීමට විත්තිකරු සහ
එයට සූදානම් වී එම මරණය සිදු කිරීමට සහාය හා අනුබලය දී ඇති
පැහැදිලිවම ඔප්පු වී ඇත.

18 NOV 2010

මෙම නඩුවේ විත්තිය කැඳවූ අවස්ථාවේදී, මුලින්ම මෙම නඩුවේ විත්තිකරු වන ගමගේ සමන් ප්‍රියන්ත සාක්ෂි දී සිටියේය. තමා හෝමාගම නගරයේ සිට සැතපුම් 11/2ක් පමණ දුරින් පිහිටි නො: 251 දරණ නිවසේ පදිංචිකරුවෙකු බව කියා සිටියේය. එම නිවසේ තමාත්, තම මව සහ අත්තා වන සුමනාවතී නමගේ පදිංචිව සිටින බවත්, පියා මිය ගොස් ඇති බවත්, කියා සිටියේය. තම පවුලේ තමා සමඟ සහෝදර සහෝදරියන් 10 දෙනෙකු සිටින බවත්, එයින් හතර දෙනෙක් නිවස අසලම පදිංචිව කුලී වැඩ කරමින් ජීවත් වන බවත්, තමා හැර සෙසු සියළුම සහෝදර සහෝදරියන් දැනට විවාහ වී සිටින බවත් කියා සිටියේය. තම සහෝදරියන් සමග විවාහ වී සිටින තැනැත්තන් දෙදෙනෙකු රැකියා නැතිව සිටින බවත්, එක් අයෙක් මන්චි විස්කෝතු සමාගමේත්, තවත් තැනැත්තෙක් මහා මාර්ග ආයතනයේත්, සේවය කරන බවත්, තමාගේ සහෝදරියන්ද, මන්චි ආයතනයේ සාමාන්‍ය සේවිකාවක් ලෙස සේවය කරන බව පිළිගත්තේය. සෝමා ගම ඉපිද නියදගල පාසලට ගොස් ඉන් පසුව විද්‍යාලංකාර පිරිවෙනට ගොස් 10 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ බවත්ය. ඔහු පිළිගත්තේය. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට වැඩ 3 ක් සමත් වූ බවත්, විභාගය කළේ එක් වතාවක් බවත් කියා සිටියේය. රැකියාවක් කිරීමට තමා තුළ තිබුන අවශ්‍යතාවයේ හේතුවෙන් ඉන් පසුව විභාගය නො කළ බවත්, මව සහ අත්තා දුක් විඳින නිසා රැකියාවක් කිරීමේ අදහසින් මන්චි ආයතනයේ සාමාන්‍ය සේවකයෙක් වශයෙන් බැඳී මාස 4–5 සේවය කළ බව ඔහු පිළිගත්තේය. එම සේවය ස්ථිර නොකල නිසා මාස ගණනකට පසුව ඔහුගේ වැඩ නතර කළ බවත්,

18 NOV 2010

ඉන් පසුව කුලී වැඩ, කුඹුරු වැඩ, මේසන් බාස් ක්‍රියාවල යෙදී සිටි බවත්, තමාට කුඹුරු තිබෙන බවත්, විත්තිකරු පිළිගත්තේය. සාමාන්‍යයෙන් එවැනි කුලී වැඩ වල නිරතව සවස 5.00 වන විට තමා ආපසු නිවසට පැමිණෙන බවත් ඔහු කියා සිටියේය.

එක් අවස්ථාවක එනම් 1989 යේ 10 මස තමාගේ මව සහ අක්කා එකතුවී තමා හමුදාවට භාර දුන් බවත්, එසේ භාර දීමට හේතුව වූයේ, හමුද වෙන් තමාගේ නිවසට පැමිණ තමා සොයා තිබූ නිසා බවත්, විත්තිකරු පිළිගත්තේය. හමුදාව විසින් තමා සොයන ලද්දේ කුමන කාරණයක් නිසාදැයි නොදත් නමුත්, පනාගොඩ යුධ හමුදා කඳවුරට ගොස් යුධ හමුදා පොලිසියට භාර වුන බවත්, ඔවුන් තමා භාර ගෙන භාර ගත් දින රාත්‍රීනම් එම කඳවුරේ තබා ගෙන සිට අනුරාධපුර කඳවුරට එදාම රෑ රැගෙන ගිය බව ඔහු කියා සිටියේය.

අනුරාධපුර කඳවුරේ මාස 11/2ක් රඳවා සිට එහිදී අඩන්තේට්ටම් කළ බවත්, තමන්ට පහර දුන් බවත්, විත්තිකරු කියා සිටියේය. එම කඳවුරේ සිටි කෙනෙක් තමා හඳුනන තැනැත්තෙක් වූ අතර, එම තැනැත්තා පහර දුන් බවත්, කියා සිටි විත්තිකරු, තමාගෙන් ප්‍රශ්න නො කළ බව් ~~ඇ~~ XXX කියා සිටියේය. ~~තමාට පහර දෙමින් තමාගෙන්~~ ඉන් පසු අසා සිටියේ, ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධයෙන් බව්/ ඔහු කියා සිටියේය. එම පෙරමුණේ තමා සාමාජිකයෙක්ද යන්න තමාගෙන්

ප්‍රශ්න කළ බව ඔහු පිළිගත්තේය. තමා හමුදා භාරයට භාර වූන අවස්ථාවේදී රටේ භීෂණ කාලයක් තිබුන බව විත්තිකරු පිළිගත්තේය. එම කාලයේ තමා ජනතා විමුක්ති පෙරමුණට බැඳී නොසිටි බව ඔහු කියා සිටියේය. අතුරුගිරිය හමුදා භාරයේ තමා මාස 11/2ක් රඳවා සිට ඉන් පසුව හෝමාගම පොලිසියට භාර දුන් බවත්, එම කාලය මතක නැති බවත්, තමා එම පොලිසියේ ප්‍රධානියාට භාර දුන් බවත්, ඔහු ඉන් පසුව කියා සිටියේය. හෝමාගම පොලිසියේ මාසයකට ආසන්න කාලයක් තමා රඳවා සිටි නමුත්, කිසිම කරදරයක් නොකළ බව විත්තිකරු මූලික සාක්ෂියේදී මෙසේ පිළිගත්තේය:-

ප්‍ර: හෝමාගම පොලිසියේ තමාව කොපමණ කාලයක් තබා ගෙන හිටියාද ?

18 NOV 2010

උ: මාසයකට ආසන්න කාලයක්.

ප්‍ර: හෝමාගම පොලිසියේදී තමාට කිසියම් කරදරයක් කළාද ?

උ: නැහැ.

ප්‍ර: තමාට ශාරීරික පීඩාවක් කළා ද ?

උ: නැහැ.

ප්‍ර: තමාට සහකාර පොලිස් අධිකාරී කෙනෙක් මුණ ගැසුනාද ?

උ: නැහැ.

ප්‍ර: ඒ කාලය තුළ තමාව අධිකරණයට ඉදිරිපත් කළාද ?

උ: ඔව්. එක්ක ගියා.

ප්‍ර: තමාට උසාවියක නඩුවක් පවරා තිබුණාද ?

උ: ඔව්.

ප්‍ර: පසුව තමාට උසාවියකින් ඇප දුන්නාද ? තමා නිදහස් වී ගෙදර ගියාද ?

උ: ඔව්.

විත්තිකරුගේ ඉහත සඳහන් පිළිගැනීම අනුව මුල් වතාවේ අත් අඩංගුවට ගත්ත අවස්ථාවේදී හමුදාවෙන් පහර දුන් නමුත්, හෝමාගම පොලීසියෙන් කිසිවෙක් පහර නොදුන් බවත්, කිසිම ශාරීරික පීඩා වක් නොකළ බවත් පිළිගෙන ඇත. එපමණක්ද නොව පොලීසිය විසින් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර එයින් නිදහස් වී ආපසු පැමිණි බවත්, විත්තිකරු පිළිගෙන ඇත. මෙම නඩුවේ ඉහත සඳහන් විත්තිකරුගේ සාක්ෂියෙන් හෙළිදරව් වන කරුණු වලින් පැමිණිල්ල වෙනුවෙන් කැඳවන ලද නිලධාරීන්ගේ සාක්ෂි [illegible] කෙරේ. මෙම විත්තිකරුට පහර දීමට පොලීසියට අවශ්‍යතාවයක් තිබුණේ නම්, මුල් අවස්ථාවේ

එසේ පහර දීමට හැකියාව තිබුණි. නමුත්, විත්තිකරුගේ පිළිතුරට මත, මුල් අවස්ථාවේ හමුදාවෙන් තමාට පහර දුන් නමුත්, පොලීසිය තිබියට එකඟව කටයුතු කර ඇති බව විත්තිකරු පිළිගෙන ඇත.

මුල් අවස්ථාවේ අධිකරණයෙන් නිදහස් වී ඇ වීශ මාස 21/2 ක් පමණ තමා නිදහස්ව සිටි බවත්, එම කාලය තුල හෝමාගම පොලීසියෙන් තමාව නැවතත්, සෙවීමට පැමිණි බවත්, විත්තිකරු පිළිගත්තේය. හෝමාගම පොලීසියෙන්රෝෂණ ප්‍රනාන්දු එස් චරස් තමාගේ නිවසට එනවා තමා දුටු බවත්, ඒ අවස්ථාවේ තමා ගෙදර සිටි නමුත්, පොලිස් නිලධාරීන් ඇත එතැනින් පැනිදිව් බව පිළිගෙන ඇත. ඒ අවස්ථාවේදී පොලිසියෙන් තමා පසුපස එළවා පැමිණියේ නැති බව ඔහු කියා සිටියේය. පොලිසිය දුටු අවස්ථාවේදී තමා එසේ දිව ගියේ, ඊට ප්‍රථම එම පොලිසියේ මෙන්ඩිස් රාළහාමි තමා එළියට ගොස් හමු වුනොත් මරණ බවට තර්ජනය කර තිබූ නිසා බව විත්තිකරු කියා සිටියේය. එම නිසා පොලිසිය දැක බිය වී දිව්ව බව ඔහු කියා සිටියේය. එම සිද්ධියෙන් පසු පොලිසියට නැවතත් භාර වීමට තීරණය කළ බවත්, තම සහෝදරියක් එම තීරණයට පැමිණි බවත්, ඉන් පසුව නීතිඥ මහතෙකුගේ මාර්ගයෙන් පොලිසියට භාර වීමට තීරණය කළ බවත්, කියා සිටියේය. එසේ තීරණය කර 1990.05.06 වන දින නීතිඥ මහතෙකු හමුවීම සඳහා තමාත්, තම බිරිත්, අක්කා වන ගුණසේන සහ අප්පලාත් සමග මෝටර් රථයෙන් නීතිඥ මහතෙකු හමුවීමට යාමට සූදානම් වී නිවස අසලින් තුලී රෙයක් ගෙන

පාදුක්කේ සිටින එම නීතිඥ මහතා හමු වීමට සැතපුම් 11/2ක පමණ දුර ගිය බව කියා සිටියේය. එසේ ගොස් තම අය්යා වන නන්දසේන ගමගේගේ නිවසට ගිය බවත්, එය පිහිටා තිබෙන්නේ, සිටිපන මීදිවුල්ලේ බවත් කියා සිටියේය. එහිදී රථය නවත්වා රථයෙන් බැස අය්යාගේ මිත් ඇතුලටගෙනෆ් අයියා සමග කථා කර නීතිඥ මහතා හමු වීමට යාම සඳහා අනාසු පැමිනි බව විත්තිකරු කියා සිටියේය. ඒ අවස්ථාවේ හෝමාගම පොලීසියේ මහත්වරුන් සමග ජීප් රථයක් පැමිණ නතර කළ බවත්, ඒ සමග තවත් වෑන් රථයක් පැමිණ නතර කළ බවත්, විත්තිකරු පිළිගන්නේය. පැවිලිල්ලේ පොලිස් නිලධාරීන් කියා සිටියේද විත්තිකරු විසින් කියන ලද දින වන 90.05.06 වන දින ජීප් රථයකින් හා වෑන් රථයකින් ගොස් මෙම විත්තිකරුව අත් අඩංගුවට ගත් බවය. ඒ අනුව එම කරුණද විත්තිකරුගේ සාක්ෂියෙන් තහවුරු වේ. එලෙසම එම ස්ථානයේ නැවැත්වූ වෑන් රථයෙන් මෙන්ඩිස් රාළහාමි බැස තමා ලගට පැමිණ තමාව අල්ලා ගත් බවත්, ඉන් පසුව මෙන්ඩිස් රාළහාමි තමාට පහරවල් 2 - 3 ගැසූ බවත්, විත්තිකරු කියා සිටියේය. පොලිස් ජීප් රථයෙන් ජොහාන් ප්‍රනාන්දු සහ තවත් කට්ටියක් සිටි බවත්, එම කට්ටිය තමා නොදන්නා බවත්, ඉන් පසුව කියා සිටියේය. ඉනු පසුව තමාව පොලිස් ජීප් රථයේ නංවා ගෙන හෝමාගම පොලීසියට රැගෙන ගිය බවත්, ඔහු කියා සිටියේය. තමා ජීප් රථයට නංවා ගන්නා අවස්ථාවේ එම ස්ථානයේ තම මව අක්කා සහ අය්යා සිටි බවද, ඔහු කියා සිටියේය.

491.

96

18 NOV 2010

( 141 )

උදේ 8.30ට පමණ පොලිස් ස්ථානයට ගෙන ගොස් එම ජීප් රථයෙන් බස්සවා පොලිස් ස්ථානය පිටුපස කාමරයකට ඇමූ බව ඔහු කියා සිටියේය. ඉන් පසු රෝහාන් ප්‍රනාන්දු, මෙන්ඩිස් රාළහාමි සහ තවත් සාජන් වරයෙක් පැමිණ තමාගෙන් ඒ අවස්ථාවේදී ප්‍රශ්න කළ බවත්, එලෙස විනාඩි 2,3 ක් ප්‍රශ්න කළ බවත්, ඔහු කියා සිටියේය. ඒ අවස්ථාවේ රෝහාන් ප්‍රනාන්දු " තොපිව හොය හොයා හිටියේ කියා" පැවසූ බවද විත්තිකරු කියා සිටියේය. ඉන් පසුව එතැන තිබූ කඹයකින් තමාගේ අත් දෙක පිටුපසට තර බැඳ, රට පසු එතැන කාමරයේ ඇතුලේ තිබුන බාල්කයේ තමාව එල්ලූ බවත්, තමාගේ අත් පිටුපසට තර බැඳ තිබුන බවත, ඒ අනුව පොළොවේ සිට අඩි 6-7 ක් ඉහලින් එල්ලා තැබූ බවත්, විත්තිකරු කියා සිටියේය. ඉන් පසුව කකුල් දෙකට කඹයක් දමා ගැටගසා එය පිටුපස තිබුන බාල්කයක එල්ලා එතැන සිටි කට්ටිය තමාගේ බටින් [illegible] පහර දුන් බවත්, එක රාළහාමි කෙනෙක් කොන්ද උඩට නැග්ග බවත්, කියා සිටියේය. ඒ අවස්ථාවේ තමාගේ සටින් සිටි රෝෂන ප්‍රනාන්දු සහ තවත් සාජන් වරුන් හා කොස්තාපල් කට්ටිය පහර දුන් බව විත්තිකරු කියා සිටියේය. එම ස්ථානයේ මෙන්ඩිස් රාළහාමි සිටි බව තවදුරටත් කියා සිටියේය. තමාගේ පිට උඩ නැග්ග රාළහාමි තමා දන්නේ නැති බවත්, පැය 11/2ක් එලෙස පහර දුන් බවත්, විත්තිකරු තවදුරටත් කියා සිටියේය. එසේ පහර දුන් අවස්ථාවේ තමාගෙන් කිසිවක් ප්‍රශ්න නොකල බවත්, ඔහු කියා සිටියේය. එලෙස පහර දීමෙන් පසුව තමාට සිහිය නැති වූ බවත්, ඒ හේතුව නිසා තමා බිමට බාපු අවස්ථාව මතක නැති

බවත්, තවදුරටත් කියා සිටියේය. තමාට නැවත සිහිය එන විට මෙන්ඩිස් රාළහාමි, රොහාන් ප්‍රනාන්දු, සහ තවත් සාජන්වරුන් එතැන සිටි බවත්, ඉන් පසුව උඩ පනින්න කියා පහර දුන් බවත්, විත්තිකරු කියා සිටියේය. ඉන් පසුව තමාව ගෙනැවිත් කූඩුවට දමා එහි විනාඩි 10 ත් 15 ත් සිටි බවත්, ඉන් පසුව තමාව එළියට ගෙන කකුල් දෙකට මාංචු දමා ඒ අසල තිබූ දොරට මාංචු සම්බන්ධ කළ බවත්, විත්තිකරු තවදුරටත් කියා සිටියේය. ඒ අවස්ථාවේ මෙන්ඩිස් රාළහාමි පැවිණ පුද්ගලික තොරතුරු හා තමාගේ ජීවිතය සම්බන්ධ තරුණු විමසූ බවත්, එලෙස කිහිප සැරයක් ප්‍රශ්න කළ බවත්, ඔහු කියා සිටියේය.

මෙම විත්තිකරු ඉහත සඳහන් පරිදි තමාට ඉතා තදබල ලෙස රොහාන් ප්‍රනාන්දු, මෙන්ඩිස් රාළහාමි සහ තවත් අය පහර දුන් බව කියා ඇතත්, එම සිද්ධියට සහභාගී වූ රොහාන් ප්‍රනාන්දු සාක්ෂි දෙන අවස්ථාවේදී ඒ පිළිබඳව කිසිම හරස් ප්‍රශ්නයක් අසා නොමැත. මෙන්ඩිස් යන තැනැත්තා පහර දීම ගැන යෝජනා කළත්, මෙම සිද්ධිය සම්බන්ධව විත්තිකරු කියන ආකාරයේ විස්තර කිසිම විටක රෝහන් ප්‍රනාන්දුගෙන් හරස් ප්‍රශ්න විලදී අසා නැත. රෝහාන් ප්‍රනාන්දු විත්තිකරුට මෙම පහර දීම සඳහා සහභාගී වූන නිලධාරියෙක් නම්, විත්තිකරු කියන පරිදි එම විස්තර අනුව රෝහන ප්‍රනාන්දුගෙන් දීර්ඝ වශයෙන්

48

493

හරස් ප්‍රශ්න ඇසිය යුතුව තිබුන නමුත්, වෙනත් නොයෙක් ප්‍රශ්න අසා ඇතත්, පෙත්සම්කරු කියන පහර දීමට රෝහණ ප්‍රනාන්දුගේ සහභාගීත්වය පිළිබඳව කිසිම හරස් ප්‍රශ්නයක් අසා නොමැත. එසේ එම පහර දුන් නිලධාරීන්ගෙන් මේ කරුණ පිළිබඳව හරස් ප්‍රශ්න නොඇසීමට හේතුව දන්නේ පෙත්සම් පමණි.

18 NOV 2010

පෙත්සම්කරුට මෙලෙස අමානුෂික අන්දමින් පහර දුන්න නමුත්, ඔහුගෙන් කිසිම ප්‍රශ්න නැති බව මුලින් ඔහු කියා ඇත. එසේ කිසිවක් ප්‍රශ්න/ප්‍රශ්න නැති නම්, එවැනි පහර දීමේ පරමාර්ථය කුමක්දැයි පැහැදිලි නැත. පහර දීම අවසානයේ පුද්ගලික තොරතුරු විමසූ නමුත්, ඔහුට පහර දුන් හේතුව පොලිස් නිලධාරීන්ගෙන් හෙළිදරව් වූ බව පෙත්සම්කරු කියා නොමැත. මේ අනුව පෙත්සම්කරුට ... කිසිම හේතුවක් නොමැති පහර දීමක් වූ බව පෙන්වීමට උත්සාහ කර ඇත.

පෙත්සම්කරුව අත් අඩංගුවට ගත් දිනයේ ඉහත සඳහන් පරිදි එසේ අමානුෂික අන්දමින් පහර දුන් නමුත්, ඉන් පසුව තමාට කිසිම පහර දීමක් නොවූ බව පෙත්සම්කරු මෙසේ පිළිගෙන ඇත.:—

" ප්‍ර: මේ කිසියට තමාගෙන් කී සැරයක් ප්‍රශ්න කළාද එම දවසේ ?

උ: දෙතුන් සැරයක් වාගේ.

ප ප්‍ර: තමාට රට පස්සේ පහර දීමක් කළේ නැහැ ?

උ: නැහැ.

ප්‍ර: තමන් කොපමණ කල් හෝමාගම පොලීසියේ හිටියාද ඊට පස්සේ ?

උ: මාස 61/2ක් විතර හිටියා.

ප්‍ර: තමන්ව ගත්තේ 1990.06.05 වෙනිදා ?

උ: 5 වෙනි මාසේ 6 වෙනිදා.

ප්‍ර: තමන් එතැන කොච්චර කාලයක් හිටියාද ?

උ: මාස 61/2ක් විතර හිටියා.

ප්‍ර: ඒ කාලය තුලදී හෝමාගම උසාවියට එක්ක ගියා ද ?

උ: එක පාරක් එක්ක ගියා මතකයි.

ප්‍ර: තමාගේ නම කථා කලාම උසාවියේ ඇතුලට ගත්තාද ?

උ: නැත්තා.

ප්‍ර: ඒ මොකක් සම්බන්ධයෙන්ද ?

උ: අල්ලා ගෙන ඉන්න කොට නීතන්ම පොලිස් උසාවියට ඉදිරිපත් කළා.

18 NOV 2010

ප්‍ර: තමන්ව නියා ගෙන හිටියා ද ?

උ: එහෙමයි.

ප්‍ර: ෂෝර්ටා නම සහකාර පොලිස් අධිකාරීවරයා ඉදිරියට තමන්ව ඉදිරිපත් කළාද ?

උ: ඉදිරිපත් කළා.

ප්‍ර: දිනය මතක නැද්ද ?

උ: නැහැ.

ප්‍ර: තමන් සහකාර පොලිස් අධිකාරීවරයාගේ නම දන්නවාද ?

උ: අනුර සේනානායක

ප්‍ර: කොහොමද ඒ මහත්තයා ගේ නම දන්නේ ?

උ: පොලීසියෙන් දැන ගත්තා.

ප්‍ර: කවුද තමන්ව ඔය ස්ථානයට එක්ක ගෙන ගියේ ?

උ: ආකර් බණ්ඩා රාළහාමියි තව්ත් රාළහාමි කෙනෙකුයි.

ප්‍ර: ආකර් බණ්ඩා රාළහාමිව දැන ගෙන හිටියා තමන් ?

උ: දැන ගෙන හිටියා.

ප්‍ර: කොහොමද දන්නේ ?

උ: පොලීසියේ ඉන්දෙද්දී, නිතර තුඩුව ලඟට ඇවිත් එක එක්කෙනාට බැනලා යනවා.

18 NOV 2010

ප්‍ර: තමාටත් බැනලා තිබෙනවාද ?

උ: බැනලා තිබෙනවා.

ප්‍ර: තමාට පහර දී තිබෙනවා ද ?

උ: නැහැ.

ප්‍ර: තමන්ව ඊට පස්සේ එක්ක ගියේ කොහාටද ආනජ් බණ්ඩා රාළහාමි?

උ: ඒ.එස්.පී. මහත්තයා ලඟට.

ප්‍ර: රෝහන් ප්‍රනාන්දු මහත්තයා තමන් එක්ක ගියාද ?

උ: නැහැ.

ප්‍ර: තමන් එක්ක ගියේ කවුරු කවුරුද ?

උ: ආනජ් බණ්ඩා රාළහාමියි අනික් අයගේ නම මතක නැහැ.

ප්‍ර: තමන් ආතර් බණ්ඩා රාළහාමිව හඳුනනවාද ?

උ: ඒ රාළහාමි පට්ටියකගේ දත් ගැලෙව්ව බව දැන ගෙන හිටියා.

ප්‍ර: ඒ අයත් තමන් හිටපු දවස්වල හිටියා මෝවාගම පොලීසියේ ?

උ: එක දවසක් හිටියා.

ප්‍ර: දත් ගලවා තිබුනාද ?

උ: ඔව්.

ප්‍ර: තමන් දැක්කාද ඒ අය ?

උ: දැක්කා.

ප්‍ර: ඒ අයගේ දත් ගැලෙව්වා කියලා දැනගෙන හිටියා ?

උ: එහෙමයි.

ප්‍ර: මේ ආතර් බණ්ඩා රාළහාමි තමන් එක්ක හිටියේ කා ළඟටද ?

උ: අනුර සේනානායක මහත්තයා ළඟට.

18 NOV 2010

ඉහත සඳහන් විත්තිකරුගේ පිළිගැනීම මත අත් අඩංගුවට ගත් මුල් දවසේ හැර ඉන් පසුව තමාට කිසිවෙකු පහර නොදුන් බව පැහැදිලිවම පිළිගෙන ඇත. විත්තිය විසින් ඉතා දීර්ඝ ලෙස චෝදනා ඉදිරිපත් කර චෝදනා කරන ලද පොලිස් නිලධාරීන් වන රොහාන් ප්‍රනාන්දු සහ ආතර් බණ්ඩා රාළහාමි තමාට මුල් දිනයෙන් පසුව කිසිම අවස්ථාවක පහර නොදුන් බව විත්තිකරු පිළිගෙන ඇත. තවද, තමාගේ අපරාධෝච්චාරණය සටහන් කර ගත් සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා ළඟට තමා රැගෙන ගිය බවත්, එම අනුර සේනානායක මහතාව පොලිසියේදී තමා දැනගත් බවත්, විත්තිකරු ප්‍රකාශ කර ඇත. විත්තිකරුගේ ප්‍රකාශය පොලිසියෙන් කරන ලද බලපෑමක් හෝ පහර දීමක් මත ලබා ගත් බව පෙන්වීමට විත්තියෙන් ඉතා විශාල උත්සාහයක් දැරූ නමුත් විත්තිකරුගේම සාක්ෂි අනුව අත් අඩංගුවට ගත් මුල් දිනයෙන් පසු මාස 6 1/2 ක් පමණ කාලයක් පොලිසියේ රැඳී සිටියත් පසුව කිසිම අවස්ථාවක රොහාන් ප්‍රනාන්දු හෝ ආතර් බණ්ඩා හෝ පහර නොදුන් බව ස්ථිරවම පිළිගත්තේය. පොලිසියේදී ආතර් බණ්ඩා රාළහාමි තමාට බැණ ඇති නමුත් පහර දී නොමැති බව විත්තිකරුම කියා සිටියේය. මේ අනුව විත්තිය විසින් පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ට කරන ලද චෝදනා විත්තිකරුගේම සාක්ෂියෙන් අසත්‍ය බවට පත් වේ.

එපමණක් නොව තමා අත් අඩංගුවේ සිටින කාලයේ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර මහේස්ත්‍රාත් අධිකරණයේ අඩුවමක් හෝ කොට ගැසුන බවට විත්තිකරු පිළිගෙන ඇත. එය එසේ නම් විත්තිකරුට පොලිසියෙන් යම් යම් පහරදීම්

ගේ තර්ජන ගේ බලපෑම් සිදු වූයේ නම් ඒ පිළිබඳව මහේස්ත්‍රාත්වරයාට දැනුම් දිය හැකිව තිබුනි. නමුත් විත්තිකරු එවැනි පැමිණිල්ලක් කර නොමැත. මෙම නඩුවේ. ඉහතින් සඳහන් කරුණු හෙළිදරව් වී ඇත්තේ විත්තියේ. තමාගේම නීති මහතාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන අවස්ථාවේදීය. විත්තියේ නීතිඥ මහතා මෙම විත්තිකරුට " තමාට පහර දී තිබෙනවා ද " යන නමට උත්තර දෙන ආකාරයේ ප්‍රශ්නයක් ඇසූ විට නැහැ යනුවෙන් විත්තිකරු පිළිතුරු දී ඇත. මේ අනුව විත්තිකරු විසින් ඔහුගේ අපරාධ ඒවාරණය ස්වේච්ඡාවෙන් නොකරන ලද්දක් බව පෙන්වීමට පොලිස් නිලධාරින්ට කර ඇති චෝදනා අසත්‍ය චෝදනා බව පැහැදිලි වෙයි.

විත්තිකරු තවදුරටත් තමාගේම නීතිඥ මහතාගේ මූලික ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අපරාධ ඒවාරණය සටහන් කිරීම ආරම්භ කරන අවස්ථාවේදී සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා සුහදව සිටි බව මෙසේ පිළිගත්තේය:-

" ප්‍ර. ඒ යන අවස්ථාවේදී සිටියා ද අනුර සේනානායක මහතා ?

උ. හිටියා.

ප ප්‍ර. තමාට කථා කළාද ?

උ. කථා කළා.

ප්‍ර. මොකද කිව්වේ

18 NOV 2010

උ. මුලින්ම මට පුටුවක් දීල වාඩි වෙන්න කිව්වා. ඊට පස්සේ කොළ වගයක් දුන්න මට. මට කිව්ව අත්සන් කරන්න කියල කොළ ටික "

මේ අනුව සහකාර පොලිස් අධිකාරි අනුර සේනානායක ළඟට ගෙන ගිය විට ඔහුට වාඩි වීමට පවා දුන් බව විත්තිකරු පිළිගෙන ඇත. මුල් අවස්ථාවේදී එලෙස සුහදව කටයුතු කළත්, එම කොලවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවේදී සහකාර පොලිස් අධිකාරි අනුර සේනානායක මහතා තමාට බැන වැදුන බව විත්තිකරු මෙසේ කියා සිටියේය.

ප්‍ර. තමා අත්සන් කළාද ?

උ. එතන මම අත්සන් කළේ නැහැ.

ප්‍ර. තමා මොකද කළේ ?

උ. ඒ වෙලාවේ මට බැන්නා. අනුර සේනානායක මහතා.

ප්‍ර. මොනවා කියලද බැන්නේ ?

උ. තුණුරුදුපෙන් බැන්නා.

ප්‍ර. බැනල මොනවද තමාට කිව්වේ ?

උ. මැරුම් නොකා මේක අත්සන් කරන්න කිව්වා.

ප්‍ර. එතකොට තමා අත්සන් කළා ද ?

උ. නැහැ.

ප්‍ර. ඊට පස්සේ තමා මොකද කළේ ?

උ. මට ඒක තියවීන්න කියල මම ඉල්ලුවා.

ප්‍ර. තියවන්න දුන්නද ?

උ. නැහැ.

ප්‍ර. මො නවද කිව්වේ ?

උ. ඊට පස්සේ බැනලා කිව්වා, මම අරගෙන යන්න කියල ආතර් බන්ඩා රාළහාමිට. ඊට පස්සේ ආතර් බණ්ඩා රාළහාමි පිටි පස්සේ තවත් කාමරයකට අරගෙන ගිහින් ආතර් බන්ඩා රාළහාමි ඒ කොල ටික මට දුන්නා. දීල කිව්වා මට අත්සන් කරන්න කියලා. මම කොළ ටික ඉල්ලුවා තියවන්න.

ප්‍ර. තමාට හම්බ වුනාද තියවන්න ?

උ. නැහැ.

ප්‍ර. ඊට පස්සේ ?

උ. ඊට පස්සේ රාළහාමි මට බනින් පටන් ගත්තා. " තොපි ශුන්‍ය තරන්න හොඳ නැහැ. තො පි හිටියත් අපට තරදරේ " කියල. ඊට පස්සේ බැන බැන කිව්ව අත්සන් කරන්න කියල. ඊට පස්සේ මම අත්සන් කළා. එතන හිටිය තවත් රාළහාමි කෙනෙත්. ඒ රාළහා ටි කුවත්තුවතින් මට පිටට ගැහැව්වා.

18 NOV 2010

...සිට පිළිබඳව දී ඇති සාක්ෂි වැදගත් ලෙස පරස්පර විරෝධී ... ඔහු මුලින් කියා සිටියේ මෙම අපරාධෝ විචාරණය තමා ... බවය. තමාට යම් කිසි කොළ වගයක් දී එයට අත්සන් ... තර්ජනය කළ නමුත් එය අත්සන් කිරීම තමා ප්‍රතික්ෂේප කළ බවත්, ... අවස්ථාවේදී නැවතත් සහකාර පොලිස් අධිකාරී කාර්යාලය පිටුපස ... ගොස් තර්ජනය කළ නමුත් ඒ අවස්ථාවේදීද අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ බවත්, විත්තිකරු කියා සිටියේය. නමුත් ඉන් පසුව එම ... යට තමා අත්සන් කළ බවත්, එක ස්ථානයකට වඩා අත්සන් කළ බවත් ... ගත්තේය. ඔහු එසේ කළේ තමාට පිටට පහර දුන් නිසා බවත්, ... කියා සිටියේය. එය එසේ වුවත් මෙම තීන්දුවේ මුලින් සඳහන් ... කර ලද ඔහුගේ සාක්ෂි බණ්ඩයට අනුව මුල් අවස්ථාවේදී පහර දුන්නාට ... පසුව තමාට පහර නොදුන් බව ඔහු පිළිගෙන ඇත. තවද, මෙම ... කරුණ සම්බන්ධව සහකාර පොලිස් අධිකාරීවරයාගෙන් විත්තියෙන් ප්‍රශ්න ... කර නොමැත. ආතර් බණ්ඩා රාළහාමි ඒ අවස්ථාවේදී සිටීම යන ... කරුණ ගැන පමණක් ඔහුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත. එපමණක් නොව ... මෙම නඩුවේ මෙම අපරාධෝච්චාරණය සටහන් කරන අවස්ථාවේදී ... පරිවර්තනය කරන ලද කාන්තා පොලිස් කොස්තාපල්වරියගෙන් මේ ... සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් අසා නොමැත.

විත්තිකරු මෙම අධිකරණයේ සාක්ෂි දුන් 2 වන අවස්ථාවේ සහකාර පොලිස් අධිකාරීවරයා කොළ වගයක් දී එය

ප්‍ර. තමා දැන සිටියාද තමා ඒ ...

මොකක්ද කියල ?

උ. නැහැ.

ප්‍ර. තමා කී පොලක අත්සන් කළාද ?

උ. මතක නැහැ.

ප්‍ර. තමා එක් ස්ථානයකට වඩා වැඩි ...

කළාද ?

උ. එහෙමයි.

ප්‍ර. තමාට කොයි අවස්ථාවක යටි ...

මහතා හම්බ වුනාද ?

උ. හම්බ වුනේ නැහැ.

ප්‍ර. තමාව රට පස්සේ එම ස්ථානයේ ...

ආපසු ගෙනාවේ කෝමතමද ...

උ. ආතර් බන්ඩා රාළහාමි.

ප්‍ර. අනුර සේනානායක මහතා කිව්වද ...

කරන්න කියල ?

උ. කිව්වේ නැහැ.

මෙම නඩුවේ ඉහතින් දැක් වූ විත්තිකරුගේ ...

කොටස් පරීක්ෂා කර බැලීමේදී ඔහු මෙම අපරාධෝච්චාරණ ...

18 NOV 2010

අත්සන් කරන ලෙසට තර්ජනය කළ බව ප්‍රකාශ කර ඇතත්, මෙම සාක්ෂිකරු මුල් අවස්ථාවේ අපරාධෝච්චාරණයට අදාල පරීක්ෂණයේදී සාක්ෂි දෙමින් ඊට අමතරව සහකාර පොලිස් අධිකාරිවරයා පිස්තෝලයක් අරගෙන තමාට දික් කර මැරුම් නොකා අත්සන් කරපන් කියා පැවසූ බව ප්‍රකාශ කර ඇත. එපමණක් නොව ඒ අවස්ථාවේ විත්තිකරු සාක්ෂි දෙමින් තමාව ගෙන ගොස් මරා දමන ලෙස ආතර් බණ්ඩා රාළහාමිට නියම කළ බවත් ඔහු කියා සිටියේය. මේ පිළිබඳව විත්තිකරු මුල් අවස්ථාවේ දුන් සාක්ෂිය සහ මෙම නඩු විභාගයේදී විත්තිය කැඳවූ අවස්ථාවේදී දුන් සාක්ෂිය පරස්පර විරෝධී වේ. විශේෂයෙන්ම අනුර සේනානායක මහතා එම අවස්ථාවේදී කටයුතු කළ ආකාරය පිළිබඳව වැදගත් විස්තර විත්තිකරු සාක්ෂි දුන් අවස්ථා දෙකේදී පරස්පර විරෝධී වේ. විත්තිකරු මුල් අවස්ථාවේදී සාක්ෂි දෙන විට අනුර සේනානායක මහතාගේ හැසිරීම පිළිබඳව කර ඇති ප්‍රකාශයට වෙනස් වූ ප්‍රකාශයක් 2 වැනි අවස්ථාවේ සාක්ෂි දෙන විට ප්‍රකාශ කර ඇත. අවස්ථා දෙකේම අනුර සේනානායක මහතා තර්ජනය කළ බව විත්තිකරු කියා ඇතත්

18 NOV 2010

18 NOV 2010



එම තර්ජනය කළ ආකාරය පිළිබඳව වෙනස් වෙනස් ආකාරයට සාක්ෂි දී ඇත. තමාට පහර දුන් නමුත් ඒ පිළිබඳව අනුව සේනානායක මහතාට තමා ප්‍රකාශයක් නොකළ බව ඔහු මුල් අවස්ථාවේ සාක්ෂි දුන් විට ද පිළිගත්තේය. මේ අනුව අමසා නයේදී පොලිසියෙන් පහර දුන් නිසා මෙම ප්‍රකාශය තුමකිදැයි නොදැන අත්සන් කළා ය කියන ප්‍රකාශය පිළිගත හැකි ප්‍රකාශයක් නොවේ. මුල් අවස්ථාවේදී විත්තිකරු පිළිගෙන ඇති පරිදි අත් අඩංගුවට ගත් දින පහර දීමෙන් පසු පොලිස් නිලධාරීන් සමඟ තිසි සුහද භාවයකින් තමාට සැලකූ බව ඔහු පිළිගෙන ඇත, කරුණත් විත්තිකරුට පහර දීම පිළිබඳව ඔහු වරින් වර කර ඇති ප්‍රකාශවල පහර දීමේ විස්තරවල ඇති වෙනසත් සැලකිල්ලට ගැනීමේදී මෙම අපරාධෝච්චාරණය එම පහර දීම හේතුවෙන් කළාය කියන ප්‍රකාශය කෙසේ වත් පිළිගත නොහැකිය.

56....

ඉහත සඳහන් පරිදි අවසානයේදී අනුරසේනානායක විසින් තමාට හිරි හැරයක් කරන්න කියා ගොති බව විත්තිකරු පිළිගෙන ඇත. පසුදින පුවත් පතේ පළවූ ප්‍රවෘත්තියක් අනුව ආතර් බංඩා රාළහාමිට එරෙහිව දත් ගැලවීමක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබුන බව දැන ගැනීමට ලැබුන බවද විත්තිකරු කියා සිටියේය. ඊට අදාළ නඩු තීන්දුව වී. 1 වශයෙන් ඉදිරිපත් කර සිටියේය. විත්තියෙන් එමගින් පෙන්නුම් කිරීමට උත්සාහ කලේ එවැනි ප්‍රසිද්ධත්වයක් ඇති පොලිස් කොස්තාපල් වරයෙක් භාරයේ විත්තිකරු සහකාර පොලිස් අධිකාරි වරයා වෙත යැවීමෙන් අනියම් ආකාරයේ බලපෑමක් සිදුවුන බවය. එවැනි චෝදනා ලත් පොලිස් නිලධාරියෙක් භාරයේ යැවීමෙන් යවන සැකකරු තුල තමාටත් එවැනි දේකට මුහුණ පෑමට සිදුවේ දැයි යන බිය නිසා ඔවුන් කියන ආකාරයේ ප්‍රකාශයකට අත්සන් කිරීමේ හැකියාව ඇතිවිය හැකි බව පෙන්වීමට විත්තියෙන් උත්සාහ කර සිටියේය. එසේ වුවත් එතරම් දරදඬු පොලිස් නිලධාරියෙක් වන ආතර් බංඩා රාළහාමි වුවත්, මුල් අවස්ථාවේ තමා අත් අඩංගුවට ගත් දින හැර වෙනත් කිසිම අවස්ථාවක පහර නොදුන් බව විත්තිකරුම පිළිගත්තේය.

විත්තිකරු තවදුරටත් තමාගේම නීතිඥ මහතාගේ මූලික ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තමා අත් අඩංගුවට ගත් දවසේ ඉඳලා අනුර සේනානායක සහකාර පොලිස් අධිකාරි වරයා ලගට රැගෙන යන තුරු තමාගේ සහෝදරිය හා මෑණියන් හමුවීමට අවස්ථාවක් ලබා දුන් බව

(62)



මෙසේ පිළිගත්තේය.....

" ප්‍ර: තමා අත් අඩංගුවට ගත්තු දවසේ ඉඳලා තමා අනුර සේනානායක මහතා ලඟට ගෙනයන අතර තුරදී තමාට තමාගේ සහෝදරයන්, මෑණියන් හමුවන්න අවස්ථාවක් ලැබුනාද?

උ: හමුවුනා.

ප්‍ර: තමා අත් අඩංගුවට අරගෙන කොපමණ කාලයක්ට පසුවද තමාට එවැනි අවස්ථාවක් ලැබුනේ ?

උ: සති දෙකකට විතර පස්සේ. "

මේ අනුව විත්තිකරු අත් අඩංගුවට ගෙන සති දෙකක් තරමේ සුළු කාලයකට පසුව සිට තම මව් හා සහෝදර සහෝදරියන් හමුවීමට පොලිසිය අවස්ථාවක් ලබා දුන් බව විත්තිකරුම පිළිගෙන ඇත. මෙම අධිකරණයේ තමාට එරෙහිව ඇති චෝදනාව වන්නේ ප්‍රේම තිරතිද අල්විස් මහතාගේ මරණය සම්බන්ධයෙන් බවත්, එම ප්‍රේම තිරතිද අල්විස් මහතා ගේ නිවස තිබෙන්නේ තමාගේ නිවසේ සිට සැතැප්මක් විතර ඈතින් බවත්, විත්තිකරු පිළිගත්තේය. විත්තිකරු විසින් කරන ලද අපරාධෝච්චාරණයේ ප්‍රේම තිරතිද අල්විස් මහතාගේ නිවසේ පිහිටීම හා එම ස්ථානයට යන පාර විත්තිකරු විසින් පෙන්වීම පිළිබඳව කරුණු සඳහන් වේ. එම විස්තරයට අදාළව තමාගේමත් නීතිඥ මහතාගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් විත්තිකරු මෙසේ පිළිගෙන ඇත.....

" ප්‍ර: කාගේ මරණයක් සම්බන්ධයෙන්ද තමා මේ ගරු අධිකරණයට

18 NOV

ගෙනල්ලා තිබෙන්නේ ?

උ: ප්‍රේම කීර්තිද අල්විස් මහතාගේ මරණය සම්බන්ධයෙන්.

ප්‍ර: ඒ මහතා සිටියේ තමාගේ නිවසේ ඉඳලා කොයි තරම් දුරකින්ද?

උ: හැකැප්මක් විතර වගේ ඇතින්.

ප්‍ර: තමා ප්‍රේම කීර්තිද අල්විස් මහතා දැනගෙන සිටියාද?

උ: දැනගෙන සිටියා.

ප්‍ර: කොහොමද එයා ගැන දන්නේ ?

උ: නිවේදකයෙක් හැටියට මම දැනගෙන සිටියේ.

ප්‍ර: ඒ කියන්නේ ගුවන් විදුලියේද, රූප වාහිනියේද?

උ: රූපවාහිනියේ.

ප්‍ර: රූපවාහිනියේ මොන මොන වගේ වැඩ සටහන් වලටද ඔහු සහභාගීවෙලා තිබෙන්නේ?

උ: සෙනසුරාදා උදේ තිබෙන වැඩ සටහන් වලට.

ප්‍ර: ඒ මහතාගේ ගැන තමාගේ තිබුනේ මොන විදියේ ආකල්පයක්ද? තමාට එයා ගැන ආකල්පයක් තිබුනාද පැහැදීමක් තිබුනාද?

උ: සාමාන්‍ය අවබෝධයක් තිබුනා මට එයා ගැන.

ප්‍ර: තමා නැමැත්තෙන් සිටියාද?

උ: එහෙමයි.

ප්‍ර: ඔහු අති ප්‍රසිද්ධ නලාකරුවෙක්?

උ: එහෙමයි.

ප්‍ර: ඔහු නිවේදකයෙක් හැටියට හැර වෙනත් අංශයකින් තමා දැනගෙන සිටියාද?

උ: ගීත ලියන කෙනෙක් හැටියට දැනගෙන සිටියා.

ප්‍ර: ගීත රචකයෙක් හැටියට දැනගෙන සිටියේ?

උ: දැන සිටියා.

ප්‍ර: එයාගේ ගීත තමා අහලා තිබෙනවාද?

උ: තිබෙනවා.

ප්‍ර: තමා ඒ ගීත වලට කැමැත්තක් දැක්වුවා?

උ: කැමැත්තක් දැක්වූවා.

ප්‍ර: තමාගේ ගෙවල් කිට්ටුව කෙනෙක් කියලා ප්‍රසිද්ධියක් තිබුනා?

උ: ප්‍රසිද්ධියක් තිබුනේ නැහැ.

ප්‍ර: හෝමාගම කෙනෙක් කියලා තමා දැනගෙන සිටියාද?

උ: දැනගෙන සිටියා.

ප්‍ර: ඒ මහතා කොයි විදියේ පුද්ගලයෙක්ද කියලා තමා දැනගෙන සිටියාද?

උ: දැනගෙන සිටියේ නැහැ.

ප්‍ර: තමාට විරුද්ධව තිබූ චෝදනාව ඒ මහතාගේ මරණය සිදුකලා කියලා තවත් කණ්ඩායමක් සමග ගිහිල්ලා? ප්‍රේමකීර්තිද අල්විස් මහතා මැරුවා කියලා?

උ: නැහැ.

ප්‍ර: තමාට උවමනාවක් තිබුනාද ප්‍රේම කීර්තිද අල්විස් මහතා වගේ

18 NOV 2010

ශ්‍රේෂ්ඨ කලාකරුවෙක් හැටි පිරිමට?

උ: උවමනාවකින් නැහැ.

ප්‍ර: තමාට ඒ මහතාගෙන් යම් අකටයුත්තක් සිදුවෙලා තිබෙනවාද?

උ: නැහැ..."

18 NOV 2010

මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලද අපරාධෝච්චාරණය අනුව මියගිය ප්‍රේමකීර්තිද අල්විස් මහතාගේ ජීවිය ගැන දන්නා පුද්ගලයෙක් හැටියට සඳහන් වන්නේ මේ විත්තිකරුය. එම අපරාධෝච්චාරණයේ සඳහන් පරිදි ප්‍රේම කීර්තිද අල්විස් මහතා පදිංචි ස්ථානය දැනගෙන සිටි බවත්, එය තමාගේ නිවසේ සිට හැතැප්මක් දුරින් බවත්, විත්තිකරු මේ අනුව පිළිගෙන ඇත. එම කරුණු අපරාධෝච්චාරණයේ සඳහන් කරුණු හා සැසඳේ. එපමණක් නොව ප්‍රේම කීර්තිද අල්විස් මහතා මොන ආකාරයේ ප්‍රසිද්ධියක් උසුලන කෙනෙක්ද යන්න පිළිබඳව විත්තිකරුට මනා අවබෝධයක් තිබූ බව ඉහත සඳහන් පිළිගැනීම් වලින් පැහැදිලිවේ. ඒ මහතා මැරීමට හේතුවක්, අමනාපයක් නොතිබූ බව විත්තිකරුද කියා සිටියේය. නමුත් මෙහිදී ප්‍රේම කීර්තිද අල්විස් මහතා මරා දමා ඇත්තේ පුද්ගලික අමනාපයක් හෝ විත්තිකරුට සිදුවූ අකටයුත්තක් නිසා නොවේ. පැමිණිල්ලේ අපි-චෝදනාවේ සඳහන් පරිදි ප්‍රේම කීර්තිද අල්විස් මහතාගේ මරණය

සිදුකර ඇත්තේ දේශපාලන හේතූන් මතය. එම සිද්ධිය සිදුවූ දින ජනතා විමුක්ති පෙරමුණ මඟින් දියත් කර තිබුණු යම් යම් භීෂණ ක්‍රියා අනුව ඔවුන් විසින් දෙන ලද නියෝග ක්‍රියාත්මක නොකිරීමේ හේතුවෙන් එම මරණය සිදු කල බවට චෝදනා කර ඇත. මේ අනුව ජනතා විමුක්ති පෙරමුණ විසින් නිකුත් කරන ලද නියෝගය පරිදි කටයුතු නොකර රැකියාවේ නිරතවීමේ හේතුවෙන් ප්‍රේම කීර්ති ද අල්විස් මහතා මරා දමා ඇති බවට චෝදනා කර ඇත. හරි හෝ වැරදි හෝ වේවා එම දේශපාලන අදහස් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් රටේ පවත්නා ආණ්ඩුවට විරුද්ධව කැරලි ගැසූ අවස්ථාවක රජයේ රැකියාවක් කරන ලද නිලධාරියෙකුගේ මේ මරණය සිදුකර ඇත්තේය. එබැවින් මෙය පුද්ගලික අමනාපකමක හේතුවක් මත කර ඇති අපරාධයක් නොවේ. එකල පැවති තත්වය අනුව කවුරුන් විසින් කලා වුවත් මෙවැනි කිසිම නඩු විභාග නොපවත්වා ලයිට් කණුවල එල්ලා හෝ පාරවල් වල්/ඇඟිනේ ටයර් මත දමා පිළිස්සුන නොයෙක් අපරාධ සිදුවිය. මෙම අධිකරණයේ විත්තිකරුට එරෙහිව සිදුවූ ආකාරයට නීතියට එකඟවූ කිසිම නඩු විභාගයක් නොමැතිව එවැනි මරණ රාශියක්

එම කාලය තුල සිදුවිය. මෙම චෝදනාවට අදාළ මරණයද ඒ ආකාරයට සිදුවූවකි. ඒ හෙයින් උභය සඳහන් සාක්ෂි තත්ව අනුව ද අපරාධෝච්චාරණයේ සඳහන් පරිදි විත්තිකරු ප්‍රේම කීර්තිද අල්විස් මහතා පදිංචි වී සිටි ස්ථානය පිළිබඳ විස්තර දැන සිටි බව සනාථ වේ. එම පිළිගැනීමෙන් එම අපරාධයට සහභාගී වූ බව තහවුරු වේ.

තවද හරස් මූලික ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තම අපරාධෝච්චාරණයේ සඳහන් වන පිලිප්ද, විජ්‍රම, ලක්ෂ්මන්, යන තැනැත්තන් තමාගේ මිත්‍රයන් නොවන බවත්, ඒ අය ගැන තමා නොදන්නා බවත් කියා සිටියේය. ප්‍රේම කීර්තිද අල්විස් මහතා ඝාතනය කලා කියා චෝදනාවක ආරම්භ වූ නමුත්, එම මරණය බැලීමට එම කාලයේ පැවති යන්න පුළුවන් තමන් තමාට නොතිබුණු බවත්, විත්තිකරු කියා සිටියේය. ඒ කාලයේ එක් එක් තැනැත්තන් මරා දමා තිබුණු අතර යවුරුන් විසින් එවැනි මිනී මැරීම් කලාදැයි දන්නේ නැති නිසා තමා බිය වූ බව විත්තිකරු පිළිගත්තේය. ප්‍රේම කීර්තිද අල්විස් මහතාගේ මරණ පරීක්ෂණට ගරු ජනාධිපති තුමා වැනි පුද්ගලයන් පැමිණි බවට විත්තියේ [illegible] විනිසුරු මහතා පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ට පමණක් නොව විත්තිකරුටද යෝජනා කල නමුත්, ඒ ගැන නොදන්නා බව විත්තිකරු සහ පැමිණිල්ලේ සාක්ෂිකරුවන් යන දෙපක්ෂයම ප්‍රකාශකර සිටියේය. [illegible] ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් නොදැන සිටි බවත්,

18 NOV 2010

ඒ සමාජිකයන්ද තමා නොදැන සිටි බවත්, විත්තිකරු කටවුරවත් කියා සිටියේය. ජනතා විමුක්ති පෙරමුණේ නීති විරෝධී ක්‍රියා කිරීමකට තමා සහභාගී නොවූ අතර, ඒ පෙරමුණේ සේඛුවෙන් කිසිම අපරාධයක් තමා නොකල බවත්, විත්තිකරු කටවුරවත් කියා සිටියේය. ඒ එසේ වුවත් ගෙවල් ගිනි තැබීමක් සම්බන්ධයෙන් නඩුවක් තමාට විරෙහිව තිබී තමාට ඇප ලැබුන බවත් ඒ සිද්ධියට අදාළ නීතිය සුද්ධ සමුදාවේ සේවය හරුනමහීපාල නැමති නිලධාරියෙකුගේ බවත්, පිළිගත්තේය. එම අපරාධය සම්බන්ධව පෙරෙට්ටුවක් අවශ්‍යට තිබූ නමුත්, පෙරෙට්ටුව නොපැවැත්වූ බවත්, මේ කාත් ඒ සම්බන්ධයෙන් තමාට චෝදනාවක් ඉදිරිපත් කර නොමැති බවත්, විත්තිකරු කියා සිටියේය. තමාට වෙඩි තැබීම පිළිබඳව නඩුවක් නොතිබුනු අතර, තමාට සැවක්කුවක් හෝ නොතිබුනු බවත් කිසිම අවස්ථාවක වෙස්–මුහුණක් බැඳගෙන නොගිය බවත්, විත්තිකරු කියා සිටියේය. විත්තියේ නීතිඥ මහතාගේ කටට උත්තර දෙන ආකාරයේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් මේ මරණය සම්බන්ධයෙන් කිසිම දෙයක් දන්නේ නැති බව විත්තිකරු කියා සිටියේය.

18 NOV 2010

තමා විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරණයට හෝ කිසිම අවස්ථාවක වත් කැමැත්තෙන් අත්සන් නොකල බව ඔහු කියා සිටියේය.

විත්තිකරු රජයේ නීතිඥ මහතා විසින් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් වී.1 වශයෙන් ඉදිරිපත් කරන ලද ආතර් බංඩා වරෙහිව ඇති නඩුව පිළිබඳව අවබෝධයක් නොමැති බව මුලින්ම පිළිගත්තේය. ඒ වී.1 සඳහන් විස්තර කිසිවක් තමා නොදන්නා බවත් ඔහු පිළිගත්තේය. එම තීන්දුව අනුව ආතර් බංඩා වැරදිකරු බවත්, ඔහු දත් ගැලවූ සිද්ධිය අදාල වන්නේ පිටිපන කම්පිය සම්බන්ධයෙන් බවත්, කියා සිටියේය. නමුත් එම දත් ගැලවූ තැනැත්තා නොදන්නා බවත්, ඉන් පසුව ඔහු කියා සිටියේය. එවැනි තැනැත්තෙකු විත්ත කූඩුවේ සිටිය නමුත්, ඔහු කවුද නොදන්නා බව කියා සිටියේය. මුල් අවස්ථාවේ තමා යුද්ධ හමුදාවට භාර වී පසුව පොලිසිය මගින් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවත්, ඒ අනුව මාස 2 1/2 ක් පමණ රැඳවා ගෙන සිටි බවත්, ඔහු නැවතත් පිළිගත්තේය. තමා පළමුවෙනි වතාවට අධිකරණයේ සාක්ෂි දෙනවිට හෝමාගම පොලිසිය විසින් තමාට පහර දුන්නා යැයි කියන ප්‍රකාශයක් නොකලේ එවැනි ප්‍රශ්නයක් ඇසුවේ නැති නිසා බව විත්තිකරු ඉන් පසුව කියා සිටියේය. ඒ එසේ වුවත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී තමාට එවැනි දෙයක් ගැන පැමිණිලි කිරීමට අවස්ථාවක් තිබුන බව ඔහු පිළිගත්තේය. ඒ පිළිබඳව තමා තමාට කිසිවක් කළේදැයි මහේස්ත්‍රාත් තුමා ඇසූ අවස්ථාවේ එවැනි දෙයක් නොමැති බව මහේස්ත්‍රාත් තුමාට දැනුම්දුන් බව විත්තිකරු මෙලෙස පිළිගත්තේය.

18 NOV 2010

" ප්‍ර: තමන් එක් විභාගයකදී අධිකරණයේ සාක්ෂි දෙන අවස්ථාවේදී තියා නැහැ තිබුම අවස්ථාවක හෝමාගම පොලිසියෙන් පහර දුන්නා කියලා ?

උ: එවැනි ප්‍රශ්නයක් ඇසුවේ නැහැ .

ප්‍ර: අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී අවස්ථාවක් තිබුනේ නැද්ද, අධිකරණයේ පෙනී ඉන්න ?

උ: තිබුනා.

ප්‍ර: නම කථා කළාද ?

උ: නම කථා කළා .

ප: ඒ අවස්ථාවේදී මොනවාද කළේ ?

උ: තුවාලවට නැ ගියා.

ප්‍ර: ඊට පස්සේ ?

උ: මහේස්ත්‍රාත් ~~වරිය~~ මගෙන් ඇහුවා. තුවාල තියෙනවාද කියලා. මම නැහැ කිව්වා. බැ ඇ ලා සන්න කිව්වා. "

[stamp] 18 NOV 2010

මම් අනුව විත්තිකරුගේම පිළිතැනීම එක මහේස්ත්‍රාත්වරිය ඉදිරිපිටදී, ඔහුට තුවාල නොමැති බව ඔහු පිළිගෙන ඇත. ඔහු කියන ... එසේ

කඳුබල ලෙස පහර දුන්නේ නම්, මහේස්ත්‍රාත්වරිය ඔහුගෙන් විමසන

නීමසක අවස්ථාවේදී විත්තිකරුට ඒ සම්බන්ධව දැනුම් දීමට හැකියාවක්

තිබියදී, තුවාල නොවැති බව මහේස්ත්‍රාත්වරිය ඉදිරියේදීම විත්තිකරු

පිළිගෙන ඇත. මේ අනුව මෙම අධිකරණයේදී පොලිස් නිලධාරීන්

පහර දුන්නා පියා කළ ප්‍රකාශය එසින්ම නිෂ්ප්‍රභා වේ. මහේස්ත්‍රාත්තුමිය

ඉදිරියට ගෙන යන අවස්ථාව වන විට තමාට පහර දී තිබුන

බවත්, හමුදා කඳවුරේදී තමාට පහර දුන් බවත්, පිළිගත් විත්තිකරු

ඒ සම්බන්ධව මහේස්ත්‍රාත්වරියට නොකීවේ තමාට තුවාල සිදුවූයේ

නැති නිසා බව පිළිගන්නේය. නමුත් විත්තිකරු සාක්ෂි දෙන අවස්

–ථාවේදී හමුදා නිලධාරීන් පහර දී තුවාල සිදු වූවාදැයි ප්‍රශ්න

කිරීමේදී මෙම විත්තිකරු මූලික සාක්ෂියේදී එවැනි චෝදනාවක්

ඉදිරිපත් කර සිටියේය. නමුත් එම පහර දීම් වලින් තුවාල සිදු වූනේ

නැති බව විත්තිකරු පිළිගත්තේය. දෙවන වතාවට හෝමාගම පොලීසියෙන්

නැවතත් අත් අඩංගුවට ගෙන මාසයකට පමණ පසු මහේස්ත්‍රාත් අධිකරණයට

ඉදිරිපත් කළ බවත්, ඒ අවස්ථාවේදී මහේස්ත්‍රාත්තුමිය තමාගෙන් ප්‍රශ්න

කළ බවත්, විත්තිකරු පිළිගත්තේය. ඒ අවස්ථාවේ තමා විත්ති කූඩුවට

නැගුනාට පසු මහේස්ත්‍රාත්තුමිය තමාට ඇප නියම කළ බවත්, විත්තිකරු

පිළිගෙන ඇත. මහේස්ත්‍රාත්තුමිය ඒ අවස්ථාවේදී තමාගෙන් ප්‍රශ්න අසා ඇසූ

නමුත්, තමා වෙනුවෙන් උපාලි නම් නීතිඥ මහතෙකු පෙනී සිටි බව

විත්තිකරු පිළිගෙන ඇත. නොයෙක් වතාවක් තමාට පහර දීම ගැන

18 NOV 2010

මහේස්ත්‍රාත්තුමියට පැමිණිල්ලක් නො කරන ලද්දේ, මන්දැයි විමසන විට විත්තිකරු මෙසේ පිළිතුරු දී ඇත:-

ප්‍ර: නීතිඥ සහායක් තිබිලාත්, නීතිඥ මහත්මයා, පොලීසියේදී තමාට පහර දුන්නා කියලා කිව්වාද ?

උ: නැහැ.

ප්‍ර: ඇයි කිව්වේ නැත්තේ ?

උ: පොලීසියෙන් පහර දුන්නේ නැහැ.

ප්‍ර: දෙවන වතාවේ මහේස්ත්‍රාත් අධිකරණයේ නීතිඥ මහත්මයෙක් පෙනී සිටියදී, යුධ හමුදාවේ නිලධාරීන් පහර දීලා තිබ්බනවා ?

උ: එහෙමයි.

ප්‍ර: මහේස්ත්‍රාත්තුමියට නීතිඥ මහතා මාර්ගයෙන් ඒ බව දන්වන්න උත්සාහ කළේ නැත්තේ ඇයි ?

උ: මට එහෙම ඕනෑ වුනේ නැහැ. ඇප අරන් එළියට යන්න ඕනෑ කළේ.

ප්‍ර: නීත්‍යානුකූල නොවන ආකාරයෙම හිරිහැර පහරදීම්

18 NOV 2010

බුද්ධි හිංසා කරලා තිබියදීත් එය අ

අධිකරණයට කීමට අවස්ථාවක් තිබියදීත්,

ඇයි තමන් ඒ බව අධිකරනයට නො කිව්වේ ?

උ: මම දන්නේ නැහැ. එහෙම කියන්න පුළුවන්

කියලා.

ප්‍ර: නීතිඥ මහත්තයෙක් තමා වෙනුවෙන් පෙනී

සිටියා නේද ?

උ: එහෙමයි.

ප්‍ර: ඇයි නීතිඥ මහත්තයාට උපදෙස් දුන්නේ

නැද්ද ? දෙවන විතාවට හෝමාගම

අධිකරණයේ පෙනී සිටින කොට නීතිඥ සහායක්

ලැබුනාද නැද්ද [illegible]

උ: ලැබුනා .

ප්‍ර: තමන්ට සුභ හමුදාවෙන් ගහපු බව

කිව්වේ නැද්ද ?

උ: නීතිඥ මහත්තයා සමග හරියට කථා

කරන්න බැරි නිසා. [illegible]

519

74

( 69 )

28 NOV 2010

...න්ඩ් එහෙන්.

මෙම නඩුවේ විත්තිකරු ඉහත සඳහන් හරස් ප්‍රශ්න වලට දෙන පිළිතුරු අනුව පොලීසිය තමාට පහර නොදුන් නිසා දෙවන අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයාට පැමිණිල්ලක් නොකළ බව පැහැදිලිවම විත්තිකරු පිළිගෙන ඇත. එසේ නම් අපරාධෝච්චාරණය ලබා ගැනීමට විත්තිකරුට පොලිස් නිලධාරීන් පහර දුන්නා යැයි කියන ප්‍රකාශය විත්තිකරුගේ ඉහත පිළිගැනීමෙන් නිෂ්ප්‍රභා වේ. ඉන් පසුව මුල් අවස්ථාවේදී කුඩා නිලධාරීන්ගේ පහර දීම ගැන ප්‍රශ්න කරන විට හමුදාවෙන් පහර දුන්න බව විත්තිකරු කියා සිටියේය. හමුදාවෙන් පහර දුන් නමුත්, පොලීසියෙන් පහර නොදුන් බව මේ අනුව විත්තිකරුගේ සාක්ෂියෙන්ම සනාථ වේ. ඇප දෙන තුරු හෝමාගම පොලීසියේ මාසයක් පමණ තමා රඳවා සිටි බවත්, ඒ කාලය තුළ මෙන්ඩිස්, ආතර් බණ්ඩා යනාදි විශයෙන් පොලිස් නිලධාරීන් හඳුනා ගත් බවත්, කියා සිටියේය. සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක දන්නේ නැති නමුත්, ඔහු පොලීසියට යන එනවා දැන ගෙන සිටි බව කියා සිටියේය. තමා එම කාලය තුළ ආතර් බණ්ඩා දත් උගුල්ලන කථාව දැන ගෙන නොසිටි බවත්, විත්තිකරු පිළිගත්තේය. විත්තිකරුට හෝමාගම පොලීසියේ ඇප දීමට පෙර සිටින කාලය තුළ තමා හෝ තම සිටි වෙනත් සැකකරුවන්, ආතර් බණ්ඩා දත් ගලවන තැනැත්තා බව දැන නොසිටි බව ඔහු කියා සිටියේය.

දෙවන වතාවේදී පොලීසියේදී මෙන්ඩිස්, ආතර් බණ්ඩා යන නිලධාරීන් පහර දී මාස 4 – 5 කට පසුව පොලිස් අධිකාරී වෙත තමා ඉදිරිපත් කළ බවත්,

ඔහු පිළිගෙන ඇත. ඒ අවස්ථාවේ හෝමාගම පොලිසියේ නිලධාරීන් පහර දුන්නේ, අත් අඩංගුවට ගත් දිනයේදැයි විමසූ විට, පාපෝච්චාරණය අත්සන කරන විටත්, පහර දුන් බව කියා සිටියේය. මේ පිළිබඳව තවදුරටත්, හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් අත් අඩංගුවට ගත් දිනට පසු දිනක නැවතත් පහර දුන්නේ පාපෝච්චාරණය සටහන් කිරීමට ඉදිරිපත් කළ දිනයේ බව විත්තිකරු කියා සිටියේය. මේ පහර දීමෙන් අත් දෙක තුවාල වූ අතර, කොන්දේ අමාරුවක්ද තිබුන බවත්, එමෙන්ම තමන්ගේ කන් ඇහෙන්නේ නැති බවත්, විත්තිකරු කියා සිටියේය. කෙසේ වෙතත්, අත් අඩංගුවට ගෙන සති දෙකකට පමණ පසුව දෙමව්පියන් දැක ගැනීමට ලැබුන බවත්, ඔහු පිළිගෙන ඇත. අත් අඩංගුවට ගෙන දින දෙකකට පසු විත්තිකරු බැලීමට විත්තිකරුගේ මව පැමිණි බවට පැමිණිල්ලෙන් යෝජනා කළ විට එය මතක නැති බව විත්තිකරු කියා සිටියේය. තමාගේ මව මෙම අධිකරණයේදී මුල් අවස්ථාවේ සාක්ෂි දෙන විට විත්තිකරු බැලීමට ඔහු අත් අඩංගුවට ගෙන දින 4–5 තුල ගිය බව කියා ඇත්නම්, එය තමා පිළිනොගන්නා බව විත්තිකරු කියා සිටියේය. මේ අනුව තමාට අවශ්‍ය වන අවස්ථාවේ තමා වෙනුවෙන්ම සාක්ෂියට කැඳවන ලද තම මවගේ සාක්ෂියෙන් ප්‍රකාශ වූන කරුණද විත්තිකරු ප්‍රතික්ෂේප කර ඇත. එවැනි ප්‍රකාශයක් මව විසින් කර ඇත්නම්,

18 NOV 20..

(76)

(71 )

(521)

එය අවතතාවිමකින් කර ඇති ප්‍රකාශයක් බව ඔහු කියා ඇත. ඒ කෙසේ වෙතත්, මා එසේ කියා ඇත්නම්, ඔහු එය පිළි නොගන්නා බව නැවතත් කියා ඇත. විත්තිකරුට පොලිසිය පහර දීම පිළිබඳව තවදුරටත් හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත.:—

18 NOV 2010

ප්‍ර: දැන් තමා අත් අඩංගුවට අර ගෙන සහකාර පොලිස් අධිකාරී තෙනතුට ඉදිරිපත් කරන තෙක්, ඒ අත් අඩංගුවට ගත්ත දිනයේ තමාට පහර දුන්නා හැර වෙනත් අවස්ථාවක පහර දුන්නාද ?

උ: අත් අඩංගුවට ගන්නා විට පහර දුන්නා. ඊට පසුව නැහැ.

ප්‍ර: තමාට මාස 4–5 කිසිම හිරිහැරයක් පොලිසියෙන් කලේ නැහැ. තමාට හිරිහැර කලේ අත් අඩංගුවට ගත්ත දිනයේයි ?

උ: ඔව්.

ප්‍ර: සහකාර පොලිස් අධිකාරී වෙත යන කොට හොඳ ශරීර සෞඛ්‍යයෙන් සිටියා ?

උ: තුවාලයක් තිබුණා.

ප්‍ර: තමාට තිබුන තුවාලය මොකක්ද ?

උ: රැජ් එහෙත් තිබුණා. කකුලේ සහ අත් වල බිබිලි තිබුණා.

ප්‍ර: පොලීසියෙන් ගැහුවාට නොවෙයි නේද බිබිලි ආවේ ?

උ: පොලීසියෙන් ගැහුවාට නොවෙයි. "

18 NOV 2010

මේ අනුව මේ විත්තිකරුට පොලීසියෙන් පහර දෙන අවස්ථාවේදී ඒ පහර දුන්න ආකාරය පිළිබඳව එක් එක් අවස්ථාවේ එක් එක් ආකාරයට ප්‍රකාශ කර ඇත. සමහර අවස්ථාවල පිළිගත් ප්‍රකාශය, නැවත් අවස්ථාවක ප්‍රතික්ෂේප කර ඇත. සමහර අවස්ථාවල මුලින් ප්‍රතික්ෂේප කළ ප්‍රකාශය නැවත් අවස්ථාවක පිළිගෙන ඇත. සහකාර පොලිස් අධිකාරීවරයා ඉදිරියේ තමා පාපෝච්චාරණයක් නො කළ බව ඉන් පසුව විත්තිකරු කියා සිටියේය. තමාගේ අය්යා සුධ හමුදාවේ අවුරුදු 2 ක් පමණ සිට එයින් අස් වී කුලී වැඩ කරමින් සිටි බව විත්තිකරු පිළිගත්තේය. මෙම කරුණු ඔහු විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරණයෙහි ඒ ලෙසම සටහන් වී ඇත.

තව දුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 1989 මාගම්මන නිවසේ පදිංචිව ඉන්න විට එම ප්‍රදේශයේ පුරාණ විහාරයේ

නායක ස්වාමීන් වහන්සේ නමප්, අපවත් වූ බවත්, එම අපවත්වීම සිදු වූයේ, 1989 බවද විත්තිකරු පිළිගෙන ඇත. පොලිසිය විසින් එහෙම සටහන් කර තිබෙනවා නම් එය ඇත්තක් බව විත්තිකරු පිළිගත්තේය. එම ආදාහන උත්සවයට එම ප්‍රදේශයේ පුද්ගලයෙක් හැටියට විත්තිකරු එළිපෙහෙළි කිරීමට සහභාගි වුන බව විත්තිකරු පිළිගත්තේය. එම ආදාහන උත්සවය සංවිධානය කිරීමට, තොරණ් බැඳීමට, සැරසිලි කිරීමට, කොඩි ඇඹීමට තමා සහභාගි වී සහාය වූ බව විත්තිකරු පිළිගත්තේය. එම ආදාහන උත්සවය පිළිබඳව විත්තිකරු අධිකරණයේ පිළිගත් කරුණු ඔහු විසින් කරන ලද අපරාධවිචාරණයේ වී අයුරින්ම සටහන් වී ඇත. මෙම ආදාහන උත්සවයේ කටයුතු වලට උදව් කිරීමට තමා පන්සලට ගිය බවත්, ගමේ හට්ටිය හමු වූ බවත්, විත්තිකරු පිළිගෙන ඇත. එම හට්ටිය සමඟ පත්මසිරි කියා කෙනෙක් උදව් කළාදැයි දැ විමල්ලේ නීතිඥ මහතා ප්‍රශ්න කළ විට මතක නැති බව විත්තිකරු කියා සිටියේය. නමුත් ඒ පිළිබඳව අධිකරණය දිගින් දිගටම ප්‍රශ්න කිරීමේදී එවැන්නෙක් තමාට උදව් කළ බව මෙසේ පිළිගත්තේය:-

ප්‍ර: පත්මසිරි කියන්නේ තමා හොඳට ආශ්‍රය කරන කෙනෙක්ද ?

උ: හරියට මතක නැහැ.

ප්‍ර: පත්මසිරි තමාගේ මිත්‍රයෙක්. තමාට උදව් උපකාර කළාදැයි මතක නැද්ද ?

18 NOV 2010

උ: උදව් කළා.

ප්‍ර: පත්මසිරි මේ ආදාහන උත්සවයේ ඉත්තිජන්ට බදින්න, සැකසිලි කරන්න උදව් කළා ?

උ: ඔව්.

ප්‍ර: තමා මේ පත්මසිරි හොඳට අඳුනනවා ?

උ: ඔව්.

ප්‍ර: කොහොමද පත්මසිරිව අඳුනන්නේ ?

උ: හෙල් ලග එක්කෙනෙක් හොඳ මිත්‍රයෙක්. සාමාන්‍යයෙන් ආශ්‍රය කරනවා. කථා බහ කරනවා. "

18 NOV 2010

පත්මසිරිව අඳුනන බවත්, ඔහු සම්බන්ධව කරුණු හෙළි කරමින්, විත්තිකරු අවසානයේදී, පත්මසිරි හේදින් දන්නා අඳුනන, උත්සවයේදී උදව් උපකාර කළ කෙනෙක් බවත් පිළිගත්තේය. අධිකරණයේදී ඔහු එලෙස පිළිගන්නා ලද පත්මසිරි පිළිබඳ කරුණු ඔහු විසින් කරන ලද අපරාධෝච්චාරනයේදී ඇතුළත් වේ. එම අපරාධෝච්චාරණයේ ඇතුළත් වන පරිදි පත්මසිරිගේ නිවසට යන විට තම අය්යා සහ ජේ.වී.පී. එකේ ප්‍රදේශීය නායකයන්ව සිටි මිලින්ද සහ පියසිරි යන තැනැත්තන් සිටි බවත්, ඔහු දැනට රටේ ඇති තත්වය හා ඉන්දියන්

525

හමුදාවේ ආක්‍රමනය ගැන කථා කළ බව සඳහන් වේ. ඒ අනුව එම අපරාධෝච්චාරණයේ සඳහන් පත්මසිරි [illegible] විසින් [illegible] විත්තිකරු විභාග අධිකරණයේදී දෙන ලද සාක්ෂියෙන් පිළිගෙන ඇත. තවදුරටත් විත්තිකරු රජයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අපරාධෝච්චාරණයේ සඳහන් යම් යම් කරුණු විභාග අධිකරණයේදී මෙසේ පිළිගෙන ඇත. :-

ප්‍ර: ඇන් ආදාහන උත්සවයේ කටයුතු පිළිබඳව හමුදාවේ සිටි කරුණාසේන අය්යා උදව් වුනාද ?

උ: සමහර විට උදව් වෙන්න ඇති.

ප්‍ර: ඇන් ආදාහන උත්සවය සංවිධානය කරන කොට තමා දවසක් ඒ හොඳට දන්නා හඳුනන ආදාහන උත්සවයට උදව් උපකාර කළ පත්මසිරි තමාගේ නිවසට ඒ කැමට යන අවස්ථාවේදී තමා ගේ කරුණාසේන අය්යා සමග පියසිරි කියා කෙනෙක් හමු වුනාද ?

උ: ඔව්.

ප්‍ර: කවුද පියසිරි කියන්නේ ?

උ: ? හෙවිල් ලග එක්කෙනෙක්.

18 NOV 2010

ප්‍ර: පියසිරි ආදාහන උත්සවයට උදව්
වුනාද ?

උ: ඉන්න ඇති උදව් කරන්න ඇති.

ප්‍ර: තමා නිශාන්ත සියා කොහෙද දන්නවාද?

උ: නැහැ.

ප්‍ර: පසුව දැන ගත්තා ද ?

උ: ඔව්.

ප්‍ර: කොහේ ඉන්න කොටද ?

උ: ගෙදර ඉන්න කොට.

ප්‍ර: නිශාන්ත ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ
වී කටයුතු කළ නිසා අත් අඩංගුවට ගෙන
බූස්ස කඳවුරේ රඳවා සිටි බව දන්නවාද ?

උ: ඔව්.

ප්‍ර: ඒ විගේම තමාගේ සහෝදරයා වන
කරුණාසේන ත්‍රස්තවාදී ක්‍රියා නිසා බූස්සේ
කඳවුරේ රඳවා සිටින බව දන්නවා ද ?

උ: ත්‍රස්තවාදී කටයුතු වලට සියා දන්නේ නැහැ. "

18 NOV 2010

විත්තිකරුගේ සාක්ෂියෙන් පිළිගෙන ඇති ඉහත සඳහන්

කරුණු ඔහු විසින් කරන ලද අපරාධෝච්චාරණය හා සංසන්දනයවේ. පියසිරි හා පත්මසිරි යන තැනැත්තන් පිළිබඳ විස්තර අපරාධෝච්චාරණයේ ඒ අයුරින් සඳහන්වේ.

මේ පිළිබඳව රජයේ නීතිඥ මහතා තවදුරටත් විත්තිකරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී, තමාගේ සහෝදරයෙකු වන කරුණාසේන පිළිබඳව සහකාර පොලිස් අධිකාරීවරයා සටහන් කර තිබෙනවා නම්, එම කරුණු හරි බව මෙසේ පිළිගෙන ඇත.:-

ප්‍ර: ගරු අධිකරණයට කියා සිටියා, කරුණාසේන කියන සහෝදරයා බූස්ස කඳවුරේ ඉන්නවා කියා ?

උ: ඔව්.

ප්‍ර: එහෙම දෙයක් සහකාර පොලිස් අධිකාරීවරයා සටහන් කර තිබෙනවා නම් එය හරි බවට පිළිගන්නවාද ?

උ: එය හරි ........

ප්‍ර: තමා පිළිගන්නවාද සහෝදරයා බූස්ස කඳවුරේ රඳවා සිටින බව ?

උ: ඔව්.

ප්‍ර: මීට කලින් පිළිගත්තා කරුණාසේනට 'මහත්තයා' කියා හඳුන්වන බව ?

උ: ඔව්.

ප්‍ර: 1989.7 වන මාසේ මාගම්මන පුරාණ විහාරයේ පැවති ආදාහන උත්සව කටයුතු සම්බන්ධයෙන් උදව් වුනා ?

6 උ: ඔව්.

ප්‍ර: සහකාර පොලිස් අධිකාරීවරයා එවැනි දෙයක් සටහන් කර තිබෙනවා නම් එය හරිද ?

උ: ඔව්.

18 NOV 2010

මේ අනුව අපරාධෝච්චාරණයේ යම් යම් කරුණු සහකාර පොලිස් අධිකාරී සටහන් කර තිබීම නිවැරදි බව විත්තිකරු පිළිගෙන ඇත.

ඉහත සඳහන් මාගම්මන පුරාණ විහාරයේ පැවති ආදාහන උත්සවයට සහභාගීවීම පිළිබඳව පොලිස් අධිකාරීවරයා සටහන් කර ගත් අපරාධෝච්චාරණයේ සඳහන් වී තිබීම නිවැරදි බව ඉන් පසුව විත්තිකරු පිළිගෙන ඇත. එම උත්සවයට තමා උදව් කළ බව සහකාර පොලිස් අධිකාරීවරයා සටහන් කර තිබේ නම් එයද පිළිගන්නා බව විත්තිකරු කියා සිටියේය. විත්තිකරු ඉන් පසුව හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, සහකාර පොලිස් අධිකාරීවරයාට තමා නොකිව්ව දෙයක් අපරාධෝච්චාරණයේ සටහන් කර තිබෙනවාදැයි විමසූ විට " මම කිසි දෙයක් සඳහන් කළේ නැහැ." යනුවෙන් පිළිතුරු දී ඇත. කෙසේ වෙතත්, පන්සලේ තමා කියා කියන කාරණයක්, ඉහත පත්වසිරි සහ පියසිරි උදව් කළ කරුණක්, තමා පිළිගන්නා බව විත්තිකරු කියා සිටියේය. එමෙන්ම තරුමාගේ ගමගේ සහෝදරයා වන බවත්, ඔහු යුද්ධ හමුදාවේ සේවය කළ බවත්, ඔහු බූස්ස කඳවුරේ රඳවා සිටින බව තමා දන්නා බවත්, විත්තිකරු පිළිගත්තේය. නිශාන්ත කියන තැනැත්තා තමා සමඟ මිත්‍රව සිටි තැනැත්තෙක් නිසා තමා දන්නා බවත්, ඉන් පසුව ඔහු කියා සිටියේය. එම නිශාන්ත පසු කාලයක බූස්සේ සිටි බවද, මේ විත්තිකරු පිළිගත්තේය.

...80 පිටට

529

18 NOV 2010

තවදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පද්මසිරි සහ පියසිරි යන දෙදෙනා තමා හඳුනන බවත්, එම දෙදෙනා බූස්ස රැඳවුම් කඳවුරේ සිටින බවත් විත්තිකරු පිළිගෙන ඇත. කටුවාන නිවාස සංකීර්ණය තිබෙන ස්ථානය තමා හොඳින් දන්නා බවත්, එම නිවාස යෝජනා ක්‍රමයට තමාගේ ගෙවල් ලඟ පාරෙන් ගිය හැකි බවත් විත්තිකරු පිළි ගත්තේය. නමුත් එම නිවාස සංකීර්ණයට තමා නොයන බව ඔහු කියා සිටියේය. යමෙක් හෝමාගම සිට එනවා නම් තමාගේ ගෙවල්වලට යන්න කලින් කටුවාන නිවාස යෝජනා ක්‍රමය පසු කර යා යුතු නමුත් ඒ මාර්ගයෙන් තමා නොයන බව විත්තිකරු කියා සිටියේය. තමා බස් එකෙන් පැමිණ මාගම්මන දොලේකඩෙන් බැස තමාගේ ගෙදරට යන බව ඔහු කියා සිටියේය. එසේ වුවත් හෝමාගම සිට යනවා නම් කටුවාන නිවාස යෝජනා ක්‍රමය පසු කර යා යුතු බව ඔහු ඉන් පසු පිළිගත්තේය. මිය ගිය ප්‍රේමකීර්ති ද අල්විස් මහතා හෝමාගම ඉන්නවා කියා දන්නා නමුත් කොහේ ඉන්නවා ද කියා දන්නේ නැති බව ඉන් පසු ඔහු කියා සිටියේය. මේ අවස්ථාවේදී මෙම නඩුවේ විත්තිකරු විසින් කරන ලදැයි කියන අපරාධෝච්චාරණයට අයත් කොටස් පැ. 7 ඒ සිට පැ. 7 කිව්. දක්වා වූ උධෘත වෙන් වෙන් වශයෙන් විත්තිකරුට කියවා දී එවැනි ප්‍රකාශයක් ඔහු විසින් කළ බව පැමිණිල්ලේ නීතිඥ මහතා යෝජනා කළ විට විත්තිකරු ඒ සියල්ලම ප්‍රතික්ෂේප කර සිටියේය. එවැනි ප්‍රකාශ තමා නොකළ බව විත්තිකරු කියා සිටියේය.

තවදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පොලිස් ස්ථානයේ තමා සිටින විට තමාගේ මව තමා බැලීමට පැමිණි අවස්ථාවේදී තමාට වූ තුවාල සම්බන්ධයෙන් ඇයට කියා සිටි විට ඇය නුගේගොඩ පොලිසියට ගොස් ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළ බව පිළිගත්තේය. එම පැමිණිල්ල කිරීමට තමාගේ සහෝදරයා වන ගුණසේන උදව් කළ බවත් එම ගුණසේන නැමැති තමාගේ අයියා පොලිසිය සමඟ සමීප සම්බන්ධතාවක් තිබෙන බවත් විත්තිකරු පිළිගෙන ඇත. ගුණසේන නැමැති එම තම සහෝදරයා උසස් නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් කීමට ඉඩ ප්‍රස්ථාව තිබුන බව විත්තිකරු පිළිගත්තේය. එවැනි පැමිණිලි හේතුවෙන් පොලිසියේ ලොකු මහත්තයා තමා ගෙනැවිත් ඒ පිළිබඳව විමසූ නමුත් වෙන කිසිවක් නොකළ බව විත්තිකරු කියා සිටියේය. තමා සම්බන්ධව පැමිණිල්ල නුගේගොඩ පොලිසියට කළේ තමාගේ ගුණසේන නැමැති අයියා බව ඔහු කියා සිටියේය. තමාගේ සහෝදරයින් අතරින් පිටිපන පුසා යනුමෙන් හඳුන්වන්නේ ගුණසේන නැමැති තමාගේ අයියා බවත් එම අයියා පොලිසියේ වෑන් රථයේ වැඩ කරන බවත් ඔහු පිළිගත්තේය. තමාගේ අයියාට අයත් පුද්ගලික වෑන් රථය පොලිසියට අරගෙන තිබෙන අතර, එය පැදවූයේ ඔහු බව විත්තිකරු පිළිගත්තේය. තමා පොලිසියේ රඳවා ගෙන සිටින විට තමාගේ

එම අපරාධ විචාරණයේ සඳහන් බොහොමයක් කරුණු වෙනත් ප්‍රිසිවෙකු අසත්‍ය ලෙස ගොතා සටහන් කර ගත හැකි ඒවා නොවේ. එවැනි කරුණු යම් ප්‍රකාශයක ඇතුලත් කිරීමට නම් ඒවා පිළිබඳව දන්නා තැනැත්තෙකුගන්ට ඒ පිළිබඳව ප්‍රකාශ විය යුතුය.

මේ අනුව මේ නඩුවේ විත්තිකරු විසින් පැ. 1 දරණ අපරාධ විචාරණය ඔහු විසින් නොකළේය යන ප්‍රකාශය කිසි සේත් පිළිගත හැකි ප්‍රකාශයක් නොවේ. ඔහු අත් අඩංගුවට ගැනීම, ඔහුට පහර දීම හා වෙනත් වැදගත් කරුණු සම්බන්ධව මේ අධිකරණයේදී වැදගත් ලෙස පරස්පර විරෝධී ප්‍රකාශයන් කර ඇතිවා පමණක් නොව සමහර කරුණු පිළිබඳ අසත්‍ය ප්‍රකාශ ද කර ඇත. මෙවැනි සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි සත්‍ය සාක්ෂියක් ලෙස කෙසේවත් මෙම අධිකරණයට පිළිගත නොහැකි බව තීරණය කරමි. මෙම විත්තිකරුගේ සාක්ෂියෙන් පමණක් නොව ඊට ප්‍රථම මෙම නඩු විභාගයේ මුල් අවස්ථාවේදී විත්තිය වෙනුවෙන් සාක්ෂි දෙන ලද ඔහුගේ මවගේ සාක්ෂියෙන් වෙනත් විත්තිකරුවෙකුට නොලැබෙන වරප්‍රසාද මෙම විත්තිකරුට ලැබුන බව හෙළිදරව් වී ඇත. උසස් නිලධාරීන් පැමිණිලි කළාත් අවස්ථාවලදී ඒ පිළිබඳව විමසා බලා විත්තිකරුට යම් යම් පහසුකම් සැලසූ බව එම සාක්ෂිවලින් හෙළිදරව් වී ඇත. එපමණක් නොව විත්තිකරුගේ සහෝදරයෙකු පොලිසිය සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන එන පුද්ගලයෙකු බවත්, පොලිසියේ සේවය සඳහා



18 NOV 2010

එම සහෝදරයාගේ වාහනය යොදවා තිබෙන බවත් පිළිගෙන ඇත.

මේ ආදී කරුණු සියල්ලම සලකා බැලීමේදී විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශය යම් කිසි බලපෑමක් හෝ තර්ජනයක් නිසා හෝ එසේ නැති නම් සහනයක් ලබා දීමේ පොරොන්දුවක් පිට කරන ලද්දක් නොවන බව තීරණය කරමි. එම අපරාධෝච්චාරණයේ සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමේදී එහි සඳහන් කරුණු ප්‍රතික්ෂේප කිරීමට තරම් කිසිම කරුණක් විත්තියෙන් ඉදිරිපත් කර නොමැත. මෙම නඩුවේ ඉහතින් සඳහන් කරුණු සියල්ලම සැලකිල්ලට ගැනීමේදී විත්තිකරුට එරෙහිව ඇති චෝදනාව විත්තිකරු විසින් කර ඇති අපරාධෝච්චාරණයේ සඳහන් වී ඇති කරුණුවලින්ට තහවුරු වී ඇති බව තීරණය කරමි. පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද වෙනත් සාක්ෂිවලින් ද, මෙවැනි අපරාධයකට සම්බන්ධ වූ බවට විත්තිකරු ස්වේච්ඡාවෙන්ම ප්‍රකාශයක් කළ බව තහවුරු වී ඇත. මේ අනුව මෙම අපරාධයට විත්තිකරු කිසි සේත් සම්බන්ධ නොවූයේ යැයි කියන ඔහුගේ ප්‍රකාශය කිසි සේත් පිළිගතහැකි ප්‍රකාශයක් නොවන බව තීරණය කරමි. මෙම නඩුවේ විත්තිකරුට එරෙහිව ඇති චෝදනාව සාධාරණ සැකයෙන් තොරව පැමිණිල්ල විසින් ඔප්පු කර ඇති බව තීරණය කරමි. ඒ අනුව විත්තිකරුට එරෙහිව ඇති චෝදනාවට ඔහු වැරදිකරු කරමි.

13/3/94

( ඩී. ජයවික්‍රම)

මහාධිකරණ විනිසුරු - අධිකරණ අංක 2.

88

5377/93

985538

11/16

18 NOV 2010
රෙජිස්ට්‍රාර්
මහාධිකරණය

අයියා තමා බැලීමට පැමිණි බවත්, විත්තිකරු පිළිගත්තේය. තමා

සාක්ෂි දෙමින් තමාගේ සහෝදරයා තමා ගැන කිසිම උනන්දුවක්

ගත්තේ නැත කියා, කියා තිබේ නම් එය අසත්‍යයක් බව විත්තිකරු

කියා සිටියේය.

මෙම නඩුවේ විත්තිකරු නැවත ප්‍රශ්නවලට පිළිතුරු

පියසිරි නිශාන්ත නැමැති අයත් පණාගොඩ පොලිසියෙන් අත්

බවත් කියා සිටියේය. තමා ට පොලිසියෙන් පහර දීම නිසා

තුවාල සම්බන්ධයෙන් තුරල් වගයක් සහ වීනෙටොපිනෝ ගෙන

බවත් තමාට එල්ල වී ඇති චෝදනා බොරු චෝදනා බවත්

වශයෙන් විත්තිකරු කියා සිටියේය.

මෙම නඩුවේ ඉහතින් සඳහන් විත්තිකරුගේ

ගැනීමේදී විත්තිකරුගේම සාක්ෂියෙන් හෙළිදරව් වී ඇති පරිදි

අවාසි වන අවස්ථාවලදී අසත්‍ය ප්‍රකාශයක් වුවත් කළහැකි

බව පෙනී යයි. තවද, පිටස්තර පුද්ගලයින්ට නො

දැනගත නොහැකි පුද්ගලික තරුණ රාශියක් ඔහුගේ අපරාධ

සඳහන්ව ඇති අතර, එම තරුණ වලින් සමහර තරුණ

විවෘත අධිකරණයේදී පිළිගත්තේය. මෙම නඩුවේ විත්තිකරු

අධිකරණයේ දෙන ලද සාක්ෂිවලදී පිළිගත් යම් යම් පිළිගැනීම්

අපරාධෝච්චාරණයේ සඳහන් යම් යම් තරුණ සංසන්දනය